ධම්මනියාමතාවය - 6

පූජ්‍ය ඉලුක්ගම අතථදස්සි සවාමීන් වහන්සේ.

පිට කවරයේ ඇතුල්පැත්ත.

ධම්මනියාමතාවය - 6

පටිච්චසමුපපාදය සුත්තනතභාජනීය සහ අභිධම්මභාජනීය
ලෙස විවරණය කෙරෙන ධම් සාකච්ඡා මාලාව.

2021.02.27වැනි දින පවත්වන ලද
පස්වැනි ධම් දේශනාව.

අවිජ්ජා පච්චයා සංඛාරා (නිර්දේශ වණ්ණනාව - 2).

සංවිධානය : සවනට සිසිලස ජාත්‍යන්තර ධම් දේශනා ගුවන්
විදුලිය සහ සජීවී ධම් සාකච්ඡා මණ්ඩපය.

පූජ්‍ය ඉලුක්ගම අතථදස්සි සවාමීන් වහන්සේ.

ධම් දානය පිණිසයි.

පිටපත් කිරීම සහ සංස්කරණය:
එච්.ඒ.අමරතුංග
(දුරකථනය 041 2240228)

තාක්ෂණික දායකත්වය:
චමිලා අමරතුංග

මෙම පොත නැවත මුද්‍රණය කර පිරිසිදු
ධර්මදානයක් වශයෙන් නොමිලයේ
බෙදාහැරීමට කැමැති සැදැහැවතෙක් වේ නම්
දුරකථනයෙන් සංස්කාරක අමතා ඒ සඳහා අදාල
දේශකයන් වහන්සේගේ අවසරය ලබා ගන්නා
මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

සවනට සිසිලස ජාත්‍යන්තර ධම් දේශනා ගුවන් විදුලිය සහ සජීවී ධම් සාකච්ඡා මණ්ඩපයේ අනුග්‍රාහකත්වයෙන්

zoom තාක්ෂණය ඔස්සේ

අකුරැස්ස, ගල්ලල,

ඉදිගස්හේන ආරණ්‍ය සේනාසනාධිපති,

පූජ්‍ය ඉලුක්ගම අත්ථදස්සි ස්වාමීන් වහන්සේ,

පටිච්චසමුප්පාදය, සුත්තනතභාජනීය සහ අභිධම්මභාජනීය ලෙස විවරණය කෙරෙන ධම් සාකච්ඡා මාලාවේ

2021.02.27වැනි දින පවත්වන ලද

පස්වැනි ධම් දේශනාව යි.

අවිජ්ජා පච්චයා සංඛාරා (නිර්දේශ වණ්ණනාව - 2)

අරමුණු කරන ලද

මෙම ධම් දේශනාව

ඉමහත් ශ්‍රද්ධාවෙන් සහ ඔබ සැම කෙරෙහි උපන්

කරුණාවෙන් යුතුව

හැකිතාක් දුරට උන්වහන්සේගේ දේශනා විලාසයෙන් ම

ලිඛිත මාධ්‍යයෙන් සකස් කොට ඔබ අතට පිදීමකි .

සාකච්ඡාවක් ලිඛිතව සකස් කිරීමේදී, දේශනා විලාශය,

වචන උච්චාරණ විලාශය, ශ්‍රවණ තත්ත්වය, කාර්මික තත්ත්වය, ආදී විවිධ

ගැටලු හමුවන තැන් නිතිපතා විද්‍යමානවේ.

කෙසේ වුව ද වර්තමානයෙහි බොහෝ දෙනා නිබඳ විමසන

ආයතන නිරෝධය පිළිබඳව වූ ක්‍රම වේදය

බුද්ධ දේශනාව අශ්‍රැතවත් හුදී ජනයාට පැහැදිලි කර දිමේ

අරමුණෙන් අප ස්වාමිපාදයන් වහන්සේ අප කෙරෙහි

අනුකම්පාවෙන් කරන ලද මෙම දේශනය හොඳින් හදාරා

පරිශීලණය කොට සමාධිමත්වීමේ උත්සාහය ගන්නා මෙන් ඔබ

සැමගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

ධම්මනියාමතාවය 6

අවිජ්ජා පච්චයා සංඛාරා (නිර්දේශ වර්ණනාව - 2)

2021.02.27

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

ශ්‍රද්ධාවන්ත පින්වත්නි, අදත් අපි සුපුරුදු විදියට සෙනසුරාදා දවසේ කතාකරගෙන ආපු ආකාරයට ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර ධර්මය වන පටිච්චසමුප්පාද ධර්මය ඒ කතාකළ කොටසේ ඉඳන් ඉදිරියට කතාකරගෙන යන්න යි අදත් මේ සූදානම්වෙන්නේ.

සම්මාසම්බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයට පහළවෙලා, බෝසතානන් වහන්සේ නමක් විදියට උන්වහන්සේ කල්පනාකරලා බැලුවා, තමන්වහන්සේ ඇතුලු මුලු තුන් ලෝකයේ ම සත්ත්වයින් ඉපදෙනවා, මැරෙණවා, ලෙඩවෙනවා, ජරාවට පත්වෙනවා. නැවත ඉපදෙනවා, මැරෙණවා, ලෙඩවෙනවා, ජරාවට පත්වෙනවා.

මේ අතරතුර, ඒ ඒ සත්ත්වයින් නොයෙක් කර්ම සකස්කරගෙන, තිරිසන් අපාය, ප්‍රේතලෝකය ආදී බොහෝ තැන්වල උපදිමින්, දුක් උපදවමින්, කෙළවරක් පෙනෙන්න නැති මේ දුකේ කෙළවරක් කරගන්නේ කොහොම ද, කවදා ද මෙය කෙළවරවෙන්නේ කියලා මහා කරුණාවෙන්, බෝසත් චින්තාවෙන් උන්වහන්සේ ගේ උපාය මනසිකාරය, යෝනිසෝමනසිකාරයත් එක්ක කල්පනාකරගෙන යනකොට තමයි මේ පටිච්චසමුප්පාද ධර්මය අවබෝධයට පත්වුණේ.

පෙර නො ඇසූ විරූ, ඒ ධර්මඥානය, ධර්මය අවබෝධවුනේ ඇත්තට ම මේ ලෝක සත්ත්වයා මේ සැරිසරන්නේ, දුක් විඳිමින් ඇවිදින්නේ මේ තියන,

- මේ අවිද්‍යාදී අන්ධකාරය නිසා නේ ද.
- මේ හේතු-ඵල දහමක් ක්‍රියාත්මක වෙන තැන ඒ ධර්මයන් අවබෝධකරගැනීමට නො හැකිවීම නිසා නේද

කියන මේ පටිච්චසමුප්පාද ධර්මය හටගැනීමේ පිළිවෙලත්, ඒ වාගේ ම එහි නිරෝධ පිළිවෙළත් ඒ බෝසතානන් වහන්සේට අවබෝධවීමත් සමග ම සර්වඥතාඥානයත් සමග ලොවුතුරා සම්මා සම්බුද්ධරාජ්‍යයට පත්වුනා. මේ උතුම් පටිච්චසමුප්පාද ධර්මය දේශනා කරේ සියලු දේ ප්‍රත්‍යක්ෂ අවබෝධයෙන් යුක්ත වූ ඒ ඥානයෙන් යුතුව යි.

ඒ තථාගත උතුම් ශ්‍රී සද්ධර්මය තමයි අපි ඉදිරියෙන් තියාගන මේ අපේ මෝඩකම දුරු කරගන්න, මේ ජාති-ජරා-මරණ සියලු දුක් නිමාකරගන්න, මේ ධර්මය අපි කොහොම ද තේරුම්ගන්නේ, කොහොම ද අවබෝධ කරගන්නේ කියන කාරණාවට යි අද අපි මේ උත්සාහවත් වෙන්නේ.

අපි කතාකරගෙන ආවේ **පටිච්චසමුප්පාද සූත්‍රය** [1] යි. පටිච්චසමුප්පාද සූත්‍රයේ අපි කතා කරේ මේ අවිද්‍යාව මුල් කාරණාව කරගෙන අවිද්‍යා ප්‍රත්‍යයෙන් මේ පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර, ආනෙඤ්ජාභිසංඛාර ඇතිවෙන්නේ කොහොම ද කියන කාරණාව යි. මේ අවිද්‍යා ප්‍රත්‍යයෙන් පුඤ්ඤාභිසංඛාර ඇතිවෙන්නේ කොහොම ද කියන එක අපි ගිය සැරේ අවසන් කරා.

ඒක අපි හැමෝටම පැටලිලා තියෙන, පැටලිලා තිබිච්ච කාරණාවක්. මේ අවිද්‍යාව කියන එක ඒකාන්තයෙන් අකුසල ධර්මයක් බවත්, ඒක අනිත්‍ය විපාක ගෙනැත් දෙන දෙයක්

[1] පටිච්චසමුප්පාද සූත්‍රය. සංයුත්ත නිකාය (2) 2වැනි භා 144වැනි පිටු.

බවත් පුඤ්ඤාභිසංඛාරයට විරුද්ධවූ ම ධර්මයක් බවත් අපි දන්නවා.

ඉතින් මේ විරුද්ධ වූ අකුසල්වූ ධර්මයකින්, පින් රැස්කරගන්නේ, කුසල් රැස්කරගන්නේ, මාගී සිතක් උපදවාගන්නේ කොහොම ද කියන කාරණාව අපි හැමෝට ම ගැටලුසහගත වෙලා තිබුණේ. ඉතින් ඒ නිසා අපි ඒක පිළිබඳව, මේ කාරණාව මතුකරගෙන මේ පුඤ්ඤාභිසංඛාරයන් ඇතිවෙන ආකාරය පිළිබඳව අපි කතාකරා.

ඒ සඳහා අපි ඒ ප්‍රත්‍ය ආකාරය පිළිබඳව කතාකලා, ආරම්මණ ප්‍රත්‍යය හා උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් මේ පුඤ්ඤාභිසංඛාරයට අවිද්‍යාව ප්‍රත්‍යවෙනවා. එතකොට මේ අවිද්‍යාව කියන එක ප්‍රත්‍ය, ප්‍රත්‍ය උප්පන්න ධර්මයෝ තමයි මේ පුඤ්ඤාභි-අපුඤ්ඤාභි-ආනෙඤ්ජාභි කියලා තියෙන්නේ. ප්‍රත්‍යයෙන් හටගත්ත ධර්මයෝ, ප්‍රත්‍යුප්පන්න ධර්මයෝ. ප්‍රත්‍යයෙන් උපන් ධර්මයෝ.

ඒ අවිද්‍යාව හේතුවෙලා, ප්‍රත්‍යවෙලා, අපට පුඤ්ඤාභිසංඛාර රැස්වෙන්න ප්‍රත්‍යවෙනවා. ආලම්බන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙනවා. ඒ වාගේ ම උපනිශ්‍රය ප්‍රත්‍යයෙන්. අවිද්‍යාවේ ඇති උපකාරත්වය, බලවත් උපකාරත්වය නිසා ලෝකයා කුසල් කරගන්නවා, සත්ත්වයා කුසල්කරගන්නවා කියලා කතාකරා.

ඒකට අපි මේ මොහොතේ ම ගත්තු උපමාවක්: ධර්මශ්‍රවණ, ධර්මසාකච්ඡා, භාවනා ආදී මේ දේවල් අපි අවිද්‍යාව තියෙන නිසා ම කරනවා. අවිද්‍යාව නිසා අපිට දුක් විඳින්න වෙන නිසා, සසර යන්න වෙන නිසා, මේ අවිද්‍යාව ඇති කල්හි ම ලෝකයා පින් කරනවා, කුසල් කරනවා, භාවනා කරනවා කියලා අපි පැහැදිලි ව අපි මතුකරගෙන වටහාගත්තා. මේ අවිද්‍යාව කියන එක නො තිබුණා නම් මේ භාවනාවක්, සාකච්ඡාවක් නො වන නිසා, අවිද්‍යාව ඇතිකල්හි මේ දේ

වන නිසා, මේක ප්‍රත්‍යවෙන බවක් තියෙනවා කියලා අපි තේරුම්ගත්තා. ඒක අපි භාවනා කරළා, භාවනාවෙන් තවත් මේක ප්‍රත්‍යක්ෂකරගන්න ඕන. එහෙම ගත්තහම ලොවුතුරා බුද්ධරාජ්‍යාට පත්වීම සඳහා යම් පාරමී ධර්ම ටිකක් පුරණවා නම්, ඒ සියලු පාරමීවලට හේතුව අවිද්‍යාවයි කියන කාරණාව පිළිබඳව දැන් අපට සැකයක් උපදින්න පුළුවන්කමක් නැහැ.

බුදු-පසේබුදු-මහරහතන් වහන්සේලා බිහිවීම සඳහාත් මේ අවිද්‍යාව කියන එක ප්‍රත්‍යවෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කළා, මේ නිර්වානය කියන යමක් තියෙනවා නම් තියෙන්නේ, නිවීම කියන එකක් තියෙන්නේ ඇවිලීමක් ඇති නිසා යි. ඒ නිසා **උප්පාදයක්** කියලා ලෝකයේ තිබුණොත් තමයි ඒකට විරුද්ධ **අනුප්පාදය** කියන ධර්මතාවයක් විද්‍යාමාන වෙන්නේ කියලා, මේ නිවන පිළිබඳව ත් කතා කරා.

අපි පුඤ්ඤාභිසංඛාරයන් පිළිබඳව කතා කරා. අද අපට කතාකරන්න තියෙන්නේ අපුඤ්ඤාභිසංඛාරයි ආනෙඤ්ජාභිසංඛාර යි.

ඊට අමතරව අපි මේ පුඤ්ඤාභිසංඛාරට ම තව පොඩි කාරණා ටිකක් එකතුකරගන්න තියෙනවා. ඒ ටිකත් කතාකරලා ම, අපි අවිද්‍යා ප්‍රත්‍යයෙන් අපුඤ්ඤාභිසංඛාරය ඇතිවෙන්නේ ත්, ආනෙඤ්ජාභිසංඛාරය ඇතිවෙන්නේත් කොහොම ද කියන එක කතා කරමු.

මැද දී හෝ අන්තිමේ දී මේ සියල්ල භාවනාමාර්ගයට කොහොම ද සම්බන්ධවෙන්නේ කියන කාරණාවත් අපි කතා කරනවා. ඒ නිසා හැමෝ ම අවසානවෙනකම් හොඳින් ශ්‍රවණය කරගෙන ඉන්න. සමහරවිට ගැඹුරු කාරණා වෙන්න පුළුවන්. නමුත් හොඳින් අහගෙන හිටියොත් තමන්ට ඒ අවබෝධයත් ඇතිකරගන්න පුළුවන්.

අපට මෙතැන දී ආපසු ඒ කාරණාවට, පුඤ්ඤාභිසංඛාරයට අවිද්‍යාව ප්‍රත්‍යවීම පිළිබඳව අපට ධර්මයේ සඳහන්වන කාරණා

ටිකක් අපේ වැඩි අවබෝධය, තේරුම්ගැනීම සඳහා මම මතුකරන්නේ. මෙතැන ප්‍රශ්නයක් වශයෙන් අහනවා. *ඒකාන්තයෙන් අනිශ්ඨඵල දායක වූ, සාවද්‍ය වූ (වැරැදි සහිත දොස් සහිත වූ) ඒ අවිද්‍යාව පුණ්‍ය - ආනෙඤ්ජාභිසංස්කාරයනට ප්‍රත්‍යභාවය කෙසේ යෙදේ ද? කොසඹ බිජුවටකින් උක් නූපදිනු?*[2] කියලා ප්‍රශ්නයක් වාගේ. ඒක කවදාවත් වෙන්න බැහැ නේ. ඒ වාගේ මේ අනිශ්ඨ, අකාන්ත වූ දෙයින් යහපත් දෙයක් වෙන්න පුළුවන් ද කියලා වගේ කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන් කියලා මේ කාරණාව ඉදිරියට ගන්නවා.

අරගත්තායින් පස්සේ, පිළිතුර වශයෙන් එතැන ධම්මයේ පෙන්නනවා, *ප්‍රත්‍යයෝත්පන්න ධම්මයන්ට* - ප්‍රත්‍යයෙන් හටගත්ත ධම්මයන්ට,- *විරුද්ධ වූ ද, අවිරුදධ වූ ද, සදෘශ වූද* - විද්‍යාමාන වූ ද, *අසදෘශවූද,* - ඇත්තා වූ ද, නැත්තා වූ ද, - *ප්‍රත්‍යයය සිධ වේ. ඒ ප්‍රත්‍යය සමුප්පන්න ධම්මයෝ විපාකයෝ ම නොවෙත්.* - ඒක ප්‍රත්‍යයෙන් ධම්මයෝ, දැන් අපි කියමුකෝ, විපාකය කියන්නේ කම්මයෙන් හටගත්ත දේවල් නේ. ඒ නිසා කෙනෙකුට හිතෙන්න පුළුවන් ඉතින් කම්ම කියන එකට අනුව උපදින්න පුළුවන්. ඒ නිසා එහෙම වෙන්න පුළුවන් කියලා. නමුත් එහෙම, ඒ ප්‍රත්‍යය, ප්‍රත්‍යඋප්පන්න ධම්මයෝ ගත්තොත්, මේ කම්ම හා විපාකය කියන කාරණාව බැඳිලා ම සිද්ධවෙන දේවල් නෙවෙයි. ඒවා විපාක වශයෙන් වෙන්නත් පුළුවන්. අවිපාක වශයෙන් ලෝකයේ සිද්ධවෙන්නත් පුළුවන්.

මෙසේ වන හෙයින් කෙසේ නොයෙදේ ද යෙදේ මැයි. යෙදෙන්නේ නො වේ. කුමක් නිසා ද, *හුදෙක් ප්‍රතිත්‍යසමුප්පන්න ධම්මයනට ප්‍රතිත්‍යසමුප්පාද ධම්මයන්ගේ,* - ප්‍රත්‍යයෙන් හටගත්තු ඵලයට ප්‍රත්‍යවන ධම්මයන්ගේ - *ධම්මතාව විචිත්‍ර හෙයින් නියම නැති.* ඒ කියන්නේ එකක් කියලා අපට

[2] විශුද්ධි මාර්ගය. 17. පඤ්ඤාභූමි නිර්දේශය - පටිච්චසමුප්පාදය. ප්‍රත්‍යය විනිශ්චය

කියන්න බැහැ. විචිත්‍රවත් ඒවා, නානාකාරයන් ගන්නවා. ඒ නිසා මෙහෙම විය හැකි යි.

ඒ ස්වභාව ධර්මයන්ගේ පැවැත්මට විස්තර වශයෙන් පෙන්නනවා, ස්වභාව ධර්මයන්ගේ පැවැත්මට කියලා කිව්වේ අපට මේ පෙනෙනවා, අහනවා, දැනෙනවා, දැනගන්නවා, අපි කුසල් කරනවා, අකුසල් කරනවා, ලෝකයා මනසේ ජීවත්වෙනවා, කියලා මේ ස්කන්ධ-ධාතු-ආයතනයන්ගේ හටගැනීම, ආදිය යි.

ස්වභාව ධර්මයන් කියලා කිව් ඒවාට, *ස්වභාව ධර්මයන්ගේ ස්ථිතිය, ස්වභාවය, කෘත්‍යය යනාදියට විරුද්ධ වූ ද, අවිරුද්ධ වූ ද, ප්‍රත්‍යය ලෝකයෙහි සිද්ධයැ.* පැවැත්මට ප්‍රත්‍යභාවයන් මේ ස්වභාවය ඒකට අනුකූලව වෙන්න පුළුවන්. කෘත්‍ය වශයෙන් විරුඬ, අවිරුඬ ප්‍රත්‍යයන් ලෝකයේ සිද්ධවෙන්න පුළුවන්. උපමාවකින් පෙන්නනවා: *පූර්ව චිත්තය පශ්චිම චිත්තයට ස්ථාන විරුද්ධ ප්‍රත්‍යය යි. (දෙ සිතක් එකවර නො පවත්නා හෙයිනි.)*

ඒක අපි උදාහරණයක් වශයෙන් කියමු: ඇහැට රූපයක් ගැටුණහම චක්ඛු විඤ්ඤාණය උපදිනවා. චක්ඛු විඤ්ඤාණය ඉපදුනාට, ඉපදුනායින් පස්සේ ඒක අරමුණු කරමින් මනෝ විඤ්ඤාණය උපදිනවා. ඒක අපි හොඳාකාරව දන්නවා. රූපයක් අපි දකිනකොට චක්ඛුවිඤ්ඤාණ සිතයි. ඒක අපි හිතෙන් සිහිකරනවා. ඒ සිහිකරන කොට මනෝ විඤ්ඤාණය උපදිනවා. දැන් චක්ඛු විඤ්ඤාණ සිත ඉපදුනේ චක්ඛු වස්තුව තුළ යි. චක්ඛු ප්‍රසාදය තුළ යි. මනෝ විඤ්ඤාණය ඉපදුනේ හදය වස්තුව තුළ යි. ස්ථාන වශයෙන් සම්පූර්ණයෙන් විරුද්ධ ධර්ම දෙකක්.

හැබැයි මේ ස්ථාන වශයෙන් විරුද්ධවුනා කියලා, මේ චක්ඛු විඤ්ඤාණය ප්‍රත්‍යවුණේ නැද්ද මේ මනෝ විඤ්ඤාණයට? ප්‍රත්‍යවුණා. ඒ වාගේ මේ ප්‍රත්‍ය කියන එක විරුද්ධ ධර්මයන්

වෙන්න පුළුවන්. ස්ථාන වශයෙන් විරුඬ ප්‍රත්‍ය වෙලා, ප්‍රත්‍යුත්පන්න ධර්මයන් උපදින්න පුළුවන්.

තව සරල උපමාවක් පෙන්නනවා. *පූර්වශිල්පාදී ශික්ෂණය පසුවැ පවත්නා ශිල්පාදී ක්‍රියාවනට ස්ථාන විරුද්ධ යැ.* ස්ථාන විරුද්ධ යි නමුත් ප්‍රත්‍ය වෙනවා. උදාහරණයක් වශයෙන් අපි කියමු: අපි යම් දෙයක් දහයේ පන්තියේ දී ඉගෙනගත්තා නම්, ඒක උසස්පෙලට උපකාරවෙනවා. දහයේ පන්තිය වෙන ම ස්ථානයක්. උසස් පෙල වෙන ම ස්ථානයක්. උසස් පෙල අපට විශ්වවිද්‍යාලයට ප්‍රත්‍යවෙනවා. විශ්ව විද්‍යාලයයේ වැඩිදුර අධ්‍යාපනය සඳහා ඒක ප්‍රත්‍යවුනා. එතකොට ඒ උසස්පෙලේ දී ඉගෙනගත්ත ශිල්පය, අපට විශ්වවිද්‍යාලයේ ඉන්න, පවතින්න ප්‍රත්‍යවුණා.

ඒ වාගේ ස්ථාන වශයෙන් විරුඬ වූ ම දේවල් ප්‍රත්‍ය වශයෙන් යෙදෙන්න පුළුවන්. ඒක සමාන ම විය යුතුයි කියලා නැහැ. අකුසලයක් නම් අවිද්‍යාව, අකුසලය නිසා අකුසලයක් ම උපදින්නේ කියන කාරණාව ම වියයුතු නෑ කියන එකයි මේ පෙන්නන්නේ.

ඊට පස්සේ තව කාරණාවක් තියෙනවා: අරූප වූ කර්මය, කර්මජ රූපයන්ට ස්වභාවය විරුද්ධ යි. කර්මයේ ආයූහන ස්වභාවය යි, රූපයේ රූප්පන ස්වභාවය යි. කර්මය සාලම්බන ස්වභාවය යි. විපාකය අනාලම්බන ස්වභාවය යි.

තව උපමාවක් පෙන්නන්නේ: කර්මය නිසා කර්මජ රූප උපදිනවා. කර්මජ රූප කිව්වා ම අපි මේ චක්ඛුප්‍රසාදය, සෝතප්‍රසාදය, ඝානප්‍රසාදය ආදී මේ ඇහැ-කන-නාසය ආදී මේ කර්මජ රූප, කර්මයට අනුරූපව යි උපදින්නේ. කර්මය කියන එක අරූප ධර්මයක්. කර්මජ රූප රූප ධර්මයක්. සම්පූර්ණයෙන් ම විරුඬ ධර්ම දෙකක්. ප්‍රත්‍ය කර්මය, ප්‍රත්‍යුප්පන්නය, ගත්තහම රූප ධර්ම ටිකක්.

ස්වභාව වශයෙන් ම ගත්තහම කර්මයේ තියෙන්නේ ආයූහන ස්වභාවය යි. ඒ කියන්නේ රැස්කරන ස්වභාවය යි කර්මයේ තියෙන්නේ. රූපයේ තියෙන්නේ රුප්පන ස්වභාවය යි. රුප්පන ස්වභාවය කියන්නේ, ආකාර විකාර වෙන බව, ශීත-උෂ්ණ ආදියෙන් විකාරයට පත්වෙන බව යි රූපය තුළ තියෙන්නේ.

ස්වභාව වශයෙන් විරුද්ධ ධර්ම දෙකක්. නමුත් විරුද්ධවුණා කියලා එහෙම ක්‍රියා සිද්ධි හේතු-ඵල ක්‍රියාවන් ලෝකයේ සිද්ධ වෙනවා. *මධුර ස්වභාවය ඇති ක්ෂීර ආදිය අම්ල ස්වභාව ඇති ස්වභාව වූ දධි ආදිය ට විරුද්ධ යි.* නමුත් මේක ප්‍රත්‍යවෙනවා. ඒ කියන්නේ මධුර කියන්නේ පැණි අපි මුදවාපු කිරි ආහාරයට ගන්නකොට පැණි ටිකක් දාගන්නවා. හැබැයි පැණි කියන එක, මීපැණි හෝ, කිතුල් පැණි හෝ ගත්තොත් ඒක මධුර ස්වභාවය යි. පැනිරස ස්වභාවයෙන් යුක්ත යි. නමුත් කිරි, අම්ල යි. ඇඹුල් ස්වභාවයෙන් යුක්ත යි. නමුත් මේක, ඇඹුල් එකට පැනි දැම්මහම ඒක කිරි-පැණි කියලා අපි ආහාරයට ගන්නවා. බොහෝම ප්‍රත්‍ය යි ඒක.

අන්න ඒ වාගේ සාමාන්‍ය ලෝකයේ උපමාවෙන් හා ධර්මය අනුව පෙන්වන උපමාවෙන් ඒ සිද්ධාන්තයන් වෙන්න පුළුවන්බව තමයි අපට විස්තර කරන්නේ.

ආලෝකය චක්ඛු විඤ්ඤාණයට කෘත්‍ය වශයෙන් විරුද්ධ යි. එතකොට මේ මුලින් කිව්වේ ස්වභාව වශයෙන් ද විරුද්ධවෙන්න පුළුවන්. කෘත්‍ය වශයෙන් ද විරුද්ධ ධර්මයන් තියෙන්න පුළුවන් ඵලයට. එතකොට ආලෝකය චක්ඛුවිඤ්ඤාණය උපදින්න හේතු වෙනවා. ආලෝකයේ කෘත්‍යය තමයි ඕභාස කෘත්‍යය. ඕභාසය කියලා කියන්නේ පෙන්වීම, ආලෝකයක් ඇතිකිරීම, එතකොට ඒකේ කෘත්‍යය ආලෝකය ඒ ඕභාසය කියලා කියන්නේ පැහැපත්බව, වණ්ණවත්බව, කියන එක යි ආලෝකය. චක්ඛුවිඤ්ඤාණයේ කෘත්‍යය විජාණන කෘත්‍යයයි.

කෘත්‍ය වශයෙන් ම විරුද්ධ ධර්ම දෙකක් වුනාට චක්ඛුවිඤ්ඤාණය නමැති ඵලය උපදින්න ආලෝකය නමැති හේතුව හේතුවෙනවා.

ඊට පස්සේ ඒකට තව ලෝකයේ උපමාවක් දෙන්නේ. මේ ඇතැම් අය මද්‍යසාර පෙරීම සඳහා හකුරු භාවිතා කරනවා. හකුරු කියන එක පිපාසය දුරු කරන වෙහෙස දුරු කරන එකක්. ඒකේ කෘත්‍යය ඒක යි. මත්පැන් කියන එක මදන ස්වභාවයේ එකක්. මත්වීමේ කෘත්‍යය ස්වභාව ඇති එකක්. නමුත් මේ හකුරු, මද්‍යසාරයට ප්‍රත්‍යවෙනවා.

චක්ඛුරූපාදීහු චක්ඛුර්විඤ්ඤාණයට ස්ථාන හෙයින් අවිරුද්ධ ප්‍රත්‍යය යැ. නමුත් අවිරුද්ධව ද සමාන ප්‍රත්‍යය ද වෙන්න පුළුවන්. චක්ඛු විඤ්ඤාණයට ප්‍රත්‍යවෙන, චක්ඛුප්‍රසාදය, රූපාලම්බනය කියන මේ කාරණා ටික දැක්කහම මෙතැන සමාන ප්‍රත්‍යයක් තියෙනවා. අවිරුද්ධ ප්‍රත්‍යයක්. චක්ඛුවිඤ්ඤාණය උපදින්නේ ත් චක්ඛුප්‍රසාදයෙන්. එතකොට ඒ චක්ඛු ප්‍රසාදයට අරමුණුවන රූපාලම්බනයත් ඒ ප්‍රසාදය ම ඇසුරු කරගෙන යි පවතින්නේ. ඒ නිසා මෙතැන සමාන ප්‍රත්‍යය එතකොට චක්ඛුප්‍රසාදය රූපාලම්බන ආදී මේ දෙක ගත්තහම ප්‍රසාද රූපයි, දෙක ම රූපධර්ම දෙකක්. ඒ නිසා ඒවා අවිරුද්ධ ප්‍රත්‍යයයි.

ඊට පස්සේ ඒ වාගේ ම පළමුවෙනි සිත ජවන් සිත් ගත්තහම ජවන් සිත පළමුවෙනි ජවනය, දෙවෙනි ජවනයට ප්‍රත්‍යවෙනවා. මේක සමාන ප්‍රත්‍යයක් තියෙන්නේ. ඒ කියන්නේ එකවර අකුසල් සිත් දෙකක් ම උපදිනවා. කුසල් සිත් ගම්මුකොඃ කුසල් සිත් දෙකක් උපදින්නේ චේතනාවක්, දානයක් හෝ බුද්ධපූජාවක් අරමුණුවෙලා කුසල් සිතක් උපදිනවා. ඒ සිත ම නැවත උපදිනවා. මුලින් ඉපදිච්චි සිත දෙවෙනි සිත උපදින්න ප්‍රත්‍යවෙනවා. සමාන ප්‍රත්‍ය දෙකක්. විරුද්ධ නැහැ. එහෙම ප්‍රත්‍යවීමකුත් තියෙනවා.

ඒ වාගේ මේකෙන් කිව්වේ මම මුලින් ම කියාපු ආකාරයට මේ ප්‍රත්‍ය ධර්මයන් විචිත්‍ර යි. වෛවර්ණ යි. ඒ අනුව ප්‍රත්‍යුත්පන්න ධර්මයන් උපදින්න පුළුවන්. ඒ නිසා මේ විචිත්‍රභාවය තුළ ප්‍රත්‍ය, ප්‍රත්‍යුත්පන්න ධර්මයන් අපි තේරුම් අරගන්න ඕන. හැම වෙලාවේ ම ඵලය කියන එක හේතුවට සමාන විය යුතු නැහැ. ඒ ධර්මය අපි අවබෝධ කරගත්තහම, අපට මේ හේතු-ඵල දහම පිළිබඳව ලොකු අවබෝධයක් එනවා.

අපි ටිකක් විග්‍රහකර ගනිමු: දැන් මෙතැන බලන්න පටිච්චසමුප්පාදය ගත්තහම, පටිච්චසමුප්පාදයේ මේ, ප්‍රත්‍යවීම, පුණ්‍යාභි, අපුණ්‍යාභි, ආණෙඤ්ජාභි - මේක පොදුවේ මම කතාකරන්නේ දැන් අවබෝධ වෙන්න ඕන. මේක බොහෝම වටිනා, වැදගත් කාරණාවක්. මේක බොහොම සාවධානව අහගෙන ඉන්න ඔබ :

දැන් අපි කිව්වා, ප්‍රත්‍ය. අවිද්‍යාව, ප්‍රත්‍යයෙන් උපන් ධර්මයෝ, පුණ්‍යාභි, කුසල්, අකුසල්, සහ ආනෙඤ්ජාභිසංඛාර. එතකොට අපි දැන් මුලින් කතාකරගෙන ආවේ ප්‍රත්‍ය කියන එක සමානව ම ප්‍රත්‍යුත්පන්න ධර්මයෝ හටගන්නවා නෙවෙයි. එතකොට යම් ධර්මයක් හටගන්න, කුසලයක් හෝ අකුසලයක් හෝ හටගන්න, ප්‍රත්‍ය ඇති දෙයක් වෙන්න පුළුවන්. හැබැයි නැති දෙයක් වෙන්නත් පුළුවන් ප්‍රත්‍යය.

නමුත් දැන් අර අපට හිතෙනවා නේ මේ අපට ‘තියෙන දේ ම පෙනෙනවා, තියෙන දේ ම දැනගන්නවා‘ කියලා. එහෙම නැහැ. දැන් අපිට “මනුස්සයෙක්” කියන අදහසක් ආවොත් අපි දැනගන්නේ තියෙන දෙයක් නෙවෙයි නේ. නමුත් අපි හිතනවා මේ අපට පෙනෙන දේ තියෙනවා කියලා. අන්න ඒක තමයි අපේ මෝඩකම. ‘මනුස්සයා‘ කියලා අපට යම් අදහසක් ඇතිවුණා නම්, ඒ අදහස ඇතිවෙන්න යම් රූපයක් හේතුවුණා නම්, ඒ රූපය තුළ අපි මනුස්සයා දකිනවා. ඒ ‘මනුස්සයා‘ කියලා කෙනෙක් ඉන්නවා කියලා අපි හිතාගෙන ඉන්නවා. ඒක සිතිවිල්ලක් පමණයි.

නමුත් ධර්මයේ අපට බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, ප්‍රත්‍ය කියන එක ඇති දෙයක් වෙන්නත් පුළුවන්. නැති දෙයක් වෙන්නත් පුළුවන්. උදාහරණයක් වශයෙන් අපි කියමු: අපි හිතට ඊයේ දැකපු දෙයක් අරමුණු වෙනවා. ඊයේ දැකපු දේ කියලා අපි ගත්තොත් එහෙම එතැන මොකුත් නැහැ නේ. ඊයේ අපි යමක් දැක්කානම් ඒ දැකීමත් එක්ක, රූපය යි වේදනාව යි, සංඥාව, සංඛාර, විඥාන කියන මේ සියලු ධර්මයෝ එතැන ම නිරුද්ධවෙලා. නමුත් අපට ඒක අරමුණුවෙලා දැන්, දැන් වේදනා-සංඥා-සංඛාර-විඥාන ආදී කුසල අකුසල ධර්මයෝ උපදිනවා. එතකොට දැන් මට මේ ඵලය, කුසලයක් හෝ අකුසලයක් ඇතිවෙන්න ඊයේ හටගත්ත දේ හේතුවුනා. ඒක නැති දෙයක්. නිරුද්ධවෙච්චි දෙයක්. අපි ඇතිබවට ගන්නවා කියන එක, ඒක වෙනම කාරණාවක්. නමුත් ධර්මය වශයෙන් ගත්තොත් ඒක නැහැ; නැති දෙයක්.

එතකොට නැති දෙයක් අරමුණුවෙලත් අපට ඵල ධර්ම උපදින්න පුළුවන්. මේ ඵලය උපදින්න පුළුවන්. ඇති දෙයක් අරමුණු වෙලත් අපට ඵලය උපදින්න පුළුවන්. ඒ කියන්නේ අපි කියමු: දැන් අපට හම්බවෙනවා මනුස්සයෙක්. වණ්ණ සටහණක් හම්බවෙනවා. අපි අරමුණු කරොත් වණ්ණ සටහන, 'හා මේ වණ්ණ රූපයක්, මේ ශබ්දයක්' කියලා අරමුණු කරොත්, ඔන්න දැන් ප්‍රත්‍ය ඇත්තාවූම දෙයක්. ඒ ප්‍රත්‍යයෙන් හටගත්ත දේත් ඇත්තාවූම දෙයක්. ඒ විදියට.

ඊට පස්සේ සමාන-අසමාන ගත්තහම, ඒකත් ඒ වාගේ කාරණාවක්. අපට මේ අකුසලයක් අරමුණු වෙලා, කුසලයක් හටගන්න පුළුවන්. තමන් තුළ හටගත්තු ද්වේශය කියන ධර්මය අරමුණුවෙලා, "මට ඊයේ මේ මේ විදියේ තරහක් හටගත්තා නේ ද, ඒ තරහා හටගත්තු එක හොඳ නැහැ. මගේ මෝඩකම නිසා තමයි හටගත්තේ" කියලා අපට අර **ද්වේශය අරමුණුවෙලා අප තුළ කුසලයක් උපදින්න පුළුවන්.**

කුසලය කියන එක හටගත්ත දෙයක්. නමුත් ඒකට අරමුණු වෙච්චි ධර්මය ද්වේශය යි. සම්පූර්ණයෙන් ම අසමාන එකක්. විරුද්ධ ධර්මයක්.

සමාන දේවලුත් ඇතිවෙන්න පුළුවන්. කුසලයක් අරමුණුවෙලා කුසලයක් ඇතිවෙනවා කියන කාරණාවත් වෙන්න පුළුවන්.

ඉතින් ඒ නිසා පින්වතුනි, මේකේ අපි තේරුම්ගන්න ඕනෑ කාරණාවක් තමයි, ප්‍රත්‍ය කියන කාරණාව ගත්තහම, මේ ප්‍රත්‍ය කියන කාරණාව හටගන්න, ඒ ධර්මයෝ තිබියයුතු ම නැහැ. නමුත් මේ ප්‍රත්‍ය නිසා මේ හටගන්න ඵල ධර්මය ඒකාන්තයෙන් පවතින ධර්මයක්. විද්‍යාමාන ධර්මයක්. ඇති දෙයක්. ඒ ඇති දේ, ඒක තමයි අපි සොයාගන්නේ.

ප්‍රත්‍ය නැති එකක් වුණාට, ප්‍රත්‍යඋප්පන්න දේ නැති දෙයක් වෙන්න බැහැ. ප්‍රත්‍යයෙන් හටගත්ත දේ ඇති දෙයක් නිසා ම යි අපට ඒකේ අපට අනිත්‍ය-දුක්ඛ-අනාත්ම වශයෙන් විදර්ශනා කරන්න පුළුවන් වෙන්නේ. ප්‍රත්‍ය කියන එක දුරුකරන්න පුළුවන් වෙන්නේ අන්න ඒ නිසා යි. එතකොට හැම වෙලාවේ ම ප්‍රත්‍ය උප්පන්නය විද්‍යාමාන දෙයක්. ඇති දෙයක්. ප්‍රත්‍යය හැම වෙලාවේ ම තියෙන දෙයක් ම විය යුතු නැහැ. ඒ නිසා යි දැන් අපට අරමුණු වෙන්නේ අරමුණ යි. ඒකත් ප්‍රත්‍යයක්. එතකොට අපි බලනවා, ප්‍රත්‍යයෙන් හටගත්ත දේ, ස්කන්ධ ටික, ඇති දෙයක්. නමුත් ඒකට අපි ඒ ස්කන්ධ නිසා වැටැහෙන දේ ඇත්තට ම හරි දෙයක් වෙන්නත් පුළුවන්. වැරැදි දෙයක් වෙන්නත් පුළුවන්. ඒක අපි තව ටිකක් විග්‍රහකරගනිමු.

දැන් අපි ගත්තහම අපි කතාකරන්නේ මුල ගත්තහම, මේ අපුඤ්ඤාභිසංඛාරයයි කියලා ගත්තොත්, මේකට උපමාවක් වශයෙන් - පොදුවේ කතාකරන්නේ, අපුඤ්ඤාභිසංඛාරයන්. දැන් අපුඤ්ඤාභිසංඛාරයන් ඇතිවෙන්න අපි කතා කරා ප්‍රත්‍ය, ප්‍රත්‍යඋප්පන්න. මෙතැන ගත්තහම දැන් උදාහරණයක් අපි

ගන්නේ, මෙන්න මේ ඇහැ ගත්තහම, ඇහැට රූපයක් ගැටෙනවා.

දැන් අපට ගැටෙන්නේ සතරමහාධාතු රූපය යි. ඒ සතරමහාධාතු රූපය, ඇහැත් රූපයත්, මේ දෙක ප්‍රත්‍යවෙලා, අපට හටගන්නවා අපුඤ්ඤාභිසංඛාරයක්. අපි කියමුකෝ, අපට ලෝභමූල සිතක් හටගන්නවා කියලා. මේ ලෝභමූල සිත කියලා කිව්වහම, ඒ ලෝභමූල සිතක් හටගන්න ඇහැත්, රූපයත් දෙක ප්‍රත්‍යවුනා. ඊට පස්සේ අපට හටගත, ලෝභමූල සිත ඇතුළත බැලුවහම ස්කන්ධ පහක් - රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන කියන මේ පහක් තියෙනවා.

දැන් අපි බලමු, මේ අකුසල් සිත ඉපදුනු තැන, ස්කන්ධ පහක් හටගත්තා. හැබැයි මේකත් එකට අපට අරමුණුවුනේ සිතත් එක්ක ලෝභමූල සිතක් ඉපදුනේ, මනුස්සයා කියන අදහසක් ඇතිවෙලා. අපි උපමාවට ගත්තොත්, මනුස්සයා කියන අදහසක්. මේ මනුස්සයා කියන අදහස ඇතිවෙලා තමයි අපට මේ ස්කන්ධ පහක් හටගත්තේ. දැන් එකතොට මේ මනුස්සයා කියන අදහස ගත්තහම අපට, මනුස්සයා කියන අදහස නැති දෙයක්. ඇති දෙයක් නෙවෙයි. නමුත් මේ අදහස ඇතිකරපු ධර්ම ටික ගත්තහම, ඒවා තියෙන දේවල්. මේ රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන කියන ස්කන්ධ පහ වැයවෙලා තමයි, මේ කියන මනුස්සයා කියන අදහස අපට ඇතිවුනේ.

ඊට පස්සේ අපි කියමුකො මේ මනුස්සයා කියන අදහස ම නැවත අරමුණුවෙලා, යලිත් අපට ලෝභමූල සිතක් උපදිනවා කියලා. මුලින් සතරමහාධාතුව අරමුණුවෙලා, මනුස්සයා කියන අදහසක් ඇතිවුණා. නැවත දෙවැනි වර නැවතත් ඒ ලෝභමූල සිත ම උපදිනවා. දැන් එයාට අරමුණුවෙන්නේ මනුස්සයා කියන අදහස යි. දැන් එතකොට මනුස්සයා කියන දේ අරමුණුවෙලා එයාට උපදිනකොට, අරමුණ නැති දෙයක්. හැබැයි ඒ නිසා හටගත්ත ස්කන්ධ ටික ඇති ධර්මතාවයක්.

ඔය 'මනුස්සයා' කියන අදහස ගත්තහම මේක ඇතිකරේ මොකකින් ද? 'මනුස්සයා' කියන අදහසක් අපට ඇතිවෙනවා. **මේ අදහස පදනම්වෙලා තමයි අපට සියලු කෙලෙස් ඇතිවෙන්නේ.** කෙලෙස්, කම්, මේ සියල්ල ඇතිවෙන්නේ මනුස්සයා කියන අදහස පදනම්වෙලායි. එතකොට මේ මනුස්සයා කියන අදහස නැති දෙයක් වුණාට, මේ අදහස ඇතිකරපු ධර්මයක් තිබුණා. අන්න ඒ ධර්මය තමයි මේ ස්කන්ධ පහ තුළ, ඒ ලෝභමූල සිත තුළ හටගත්තු **මෝහය** නමැති චෛතසික ධර්මය. ඒක තමයි අපි මුලින් කතාකරේ, අවිද්‍යාව කියන කාරණාව. අවිද්‍යාව කියන කාරණාව වැයවෙලා, මනුස්සයා කියන අදහසක් ඇතිවුණා. ඒක පදනම්වෙලා ඒ සිතේ ම ලෝභය කියන කාරණාවකුත් ඇතිවෙනවා. තවත් කෙලෙස් කම් විපාක ඇතිවෙලා අපි සසර යනවා.

දැන් අපට මේ කෙලෙස් ටික, කම් ටික තිබුනොත්, ජාති-ජරා-මරණාදී දුක් විඳින්න වෙනවා. ඒ වාගේ ම මේ ජීවිතයේත් පරලොවත් බොහෝ දුක් විඳින්න වෙනවා. මේ කෙලෙස් කර්මය ඇතිවුණේ මේ කියන මනුස්සයා කියන අදහස පදනම්වෙළා යි.

දැන් අපි තේරුම්ගන්නවා, මනුස්සයා කියන අදහස නැතිවුණොත්, මේ ලෝබයත් නෑ, කෙලෙසුත් නෑ, කම්ත් නෑ.

ඒක නැතිකරන්න ගවේශණය කරනකොට අපට හම්බවෙනවා මෝහය කියන කාරණාව. ඒ මෝහය කියන කාරණාවෙන් කරපු කෘත්‍යයක් තමයි අරමුණ වරදවා පෙන්නන බව. අරමුණ වරදවා පෙන්නන බව අපි කිව්වා, මේ මනුස්සයා කියන අදහසක් පෙන්නන්නේ මෝහය යි. එතකොට ඒ වරදවා පෙන්නන ගතියට අපි අහුවෙන්නේ. ඒකට යි අපි රැවැටෙන්නේ. ඒකටයි අපි මුලාවෙලා තියෙන්නේ. නමුත් මේක කරපු ධර්මය බැළුවොත්, මෝහය

නමැති ධර්මයකින් කරා මිසක් මෙහෙ ඉන්න කෙනෙකුගෙන් කරා නෙවෙයි.

එතකොට, "මම" කියලා කෙනෙක් අපි මෙහේ නිර්මාණය කරගෙන ඒ වූ මම, මට මනුස්සයෙක් ඉන්නවා පෙණුනා කියලා අපි ගන්නවා. එතකොට අපි ගවේශණය කරලා බැළුවොත් මේ මනුස්සයා කියන අදහස මට ද ඇතිවුණේ? නැහැ. එතකොට අපට මේ මෝහය නමැති ධර්මය අපට හම්බවෙනවා. ඒක ඇති ධර්මයක්. හොඳට තේරුම්ගන්න. **මෝහය තියෙන දෙයක්. මනුස්සයා කියන අදහස නැති දෙයක්.**

මේ මෝහය පදනම්වෙලා තමයි, සියලු කෙලෙස් ඇතිවුනේ, ලෝභය ඇතිවුනේ. මෝහය නැතිකළ යුතු යි. මෝහය නැතිකළොත් මේ පුඤ්ඤාභිසංඛාරය ද නෑ. අපුඤ්ඤාභිසංඛාර ද නැතිවෙනවා.

මෝහය නැතිකරන්න අපි මොකක් ද කළ යුත්තේ? මෝහය නැතිකරන්න, ඒක නසන ධර්මයක් අපි උපදවාගන්න ඕන. අපි කියමුකෝ ආයුධයක් කියලා. ආයුධයක් අපි උපදවාගන්න ඕන. **ඒ ආයුධය තමයි විද්‍යාව.** අපි විද්‍යාව නමැති ධර්මය උපකාරකරගෙන අවිද්‍යාව නමැති මේ කෙලේසය, මේ අකුසලය විනාශකරලා දානවා. **මොකක් ද මේ විද්‍යාව කියලා අපි උපද්දවාගත්තේ?** අමුතු දෙයක් නෙවෙයි තියෙන්නේ. අපට මේ මනුස්සයා කියන අදහසයි ප්‍රකටවෙන්නේ. ඒ මනුස්සයා කියන අදහස තුළ ඇත්තට ම පවතින්නේ මොකක් ද කියලා ගවේශනය කරනවා. ඒක අපට ගවේශනය කරන්න බැහැ. ලොවුතුරා බුදුරජාණන් වහන්සේනමක් අසංඛ්‍ය කල්ප ගණනක් පාරමී පුරලා, පාරමී පුරලා, උන්වහන්සේ ප්‍රත්‍යක්ෂ වශයෙන් දැක්කා මේ ඇතුළත ඉන්නා පුද්ගලයෙක්ගෙන් නෙවෙයි මේ කාරණාව වෙන්නේ. මේ සිතේ ම හටගන්නා මෝහය නමැති ධර්මයක් තියෙනවා. ඒ ධර්මයේ බලයෙන් තමයි මේ කියන අදහස, මනුස්සයා කියන

අදහස ඇතිවෙන්නේ. ඒ නිසා අපට කමී කෙලෙස් ඇතිවෙනවා කියලාත් ඔන්න අපට බුදුරජාණන් වහන්සේ නමක් මේ ඇත්ත පෙන්නලා දෙනවා. **මෙන්න මේ ආයුධය අපට දැන් දෙනවා.**

ආයුධය දුන්නත් අපට මේක හුදු දැනීමක් විතරයි. ඇහීමක් විතර යි. ඒකට අපට අවබෝධ වුණේ නැහැ. අපට අවබෝධ වුණා නම් අපේ කෙලෙස් ටිකක් දුරුවෙන්න එපායැ. ඒ නිසා මේක අහපු පමණකින් මේක හරියන්නේ නැහැ කියලා කියන්නේ ඒ නිසායි. අපි මේක විද්‍යාව කියන කාරණාව දන්නවා. සම්මා දිට්ඨිය කියන කාරණාව දන්නවා. දැනගත්තාට කෙලෙස් ටික එහෙම ම යි.

ඉතින් අන්න ඒ නිසා දැන් අපි අවිද්‍යාව කියන කාරණාවත්, විද්‍යාව කියන කාරණාවත්, ධම් දෙකක්. **අවිද්‍යාව** මෝහය නමැති ධම්ය යි. **විද්‍යාව** ප්‍රඥාව නමැති ධම්ය යි. මේ දෙක ම විද්‍යාමාන ධම් දෙකක්. විද්‍යාව වැඩිය යුතු ධම්යක්. අවිද්‍යාව දුරුකළයුතු ධම්යක්.

යමක් දුරුකරන්න නම්, ඇති දෙයක් වෙන්න ඕන දුරුකරන්න. අපි දන්නවා මේ අනිත්‍ය-දුක්ඛ-අනාත්ම වශයෙන් බලන්නේ නැති දෙයක නෙවෙයි. ත්‍රිලක්ෂණයට නංවන්න පුළුවන් ඇති දෙයක්. ප්‍රත්‍යයෙන් හටගෙන, ප්‍රත්‍ය නැතිවෙනකොට නැතිවෙන ධම්යකට යි අපි අනිත්‍යය කියන්නේ. එහෙනම් යම් ධම්යක ත්‍රිලක්ෂණය කියන කාරණාව විද්‍යාමාන වෙනවා නම්, ඒක ඇත්තා වූ ධම්යක්. දැන් අපි මේක තියාගන්න හදනවා නෙවෙයි.

- යමක් ඇති දෙයක් වුණොත් තමයි ඒක නැතිකරන්න පුළුවන් වෙන්නේ.
- යමක් නැතිකරොත් තමයි අපට ඒ තුළ අපට යම් ඵල ධම්යක පිහිටි ස්ථිරතාවය, අපට නිවීමක් කියන එක ඇතිවෙන්නේ එහෙම දෙයක් වුනොත්.

ඒ නිසා අපි නැතිකරයුත්තේ මෝහය මිසක් මනුස්සයා කියන අදහස නෙවෙයි. මනුස්සයා කියන අදහස ඇති දෙයක් නෙවෙයි. ඒ අදහස අපි නැතිකරන්න උත්සාහවත්වෙන්න ඕන නැහැ. ඒක පොදු සම්මුති මාත්‍රයක්. හැබැයි මේ මනුස්සයා කියන අදහස ප්‍රශ්නයක් වෙන්නේ මේක සම්මුතියක් හැටියට නො දැන අපි ඇති දෙයක් බවට වටහා ගත්තොත්. ඒ අපේ මෝඩකම යි. ඒ අපට ඇතිවෙච්චි අදහස යි. අදහසේ අපි ගැලෙනවා. අදහස තුළ අපි බැසගන්නවා.

ඒ මනුස්සයා කියන අදහස රහතන්වහන්සේත් භාවිතා කරනවා. බුදුරජාණන් වහන්සේත් භාවිතා කරනවා. මේ මනුස්සයා කියන අදහස අපේ භාවනාවටවත්, සමාධියටවත් කිසිදු හානියක් කරන්නේ නැහැ. සම්මුති ලෝකයේ බුදු-පසේබුදු-මහරහතන්වහන්සේලා මේ අදහස ඇතිකරගන්නවා. මේ අදහස ඇතිකරගෙන ලෝකයේ කටයුතු කරනවා. හැබැයි උන්වහන්සේලා ඒක සම්මුතියක් බව දැනගෙන යි කටයුතු කරන්නේ.

මෝහය තියෙන කෙනා මේ ධර්මය සම්මුතියක් හැටියට නෙවෙයි, මනුස්සයා කියලා කෙනෙක් ඉන්නවා කියලා ගන්නවා. අන්න ඒ නිසා දැන් විද්‍යාව කියලා කියන්නේ, මේ මනුස්සයා කියන අදහස ඇතිවුණේ, මේ හිතේ ම යෙදුනු, මේ කියන හිතේ ම යෙදුනු, අවිද්‍යාව නමැති අනාත්ම වූ ධර්මයක් නිසා නේ ද කියලා අපි අවබෝධ කරනවා. මෝහය කියන අනාත්ම ධර්මය, අන්න ඒ අනාත්ම ධර්මය අපට වැටහෙන කොට සත්ත්ව-පුද්ගලභාවයෙන් තොරව, ඒක ම ඔහුට විද්‍යාව වෙනවා.

එතකොට මේ ස්කන්ධ පහ අපට හටගත්තු සිත යි. ලෝභය තියෙන්නෙත්, මෝහය තියෙන්නේත් මේ සිත ඇතුළේ යි. විද්‍යාව අපට උපදවාගන්න පුළුවන් දෙයක්. ඒක ඇති දෙයක්. ඒ නිසා ඒක උපදවාගත්තොත් මේ අවිද්‍යාව කියන ධර්මය නැතිවෙනවා. ඇත්තට ම විදර්ශනාවෙන් කරන්නේ මෙන්න

මේ කාරණාව යි. අපි අකුසල් නැතිකරන්න කියලා, කුසල් උපදවාගන්න කියලා, කම් කෙලෙස්, හොඳට මතක තියාගන්න, මේ කම් කෙලෙස්, දුක් දොම්නස්, සතර අපාය ආදී මේ සියල්ල ම නිර්මානයවුනේ මේ මනුස්සයා කියන අදහස පදනම්වෙලා යි. නමුත් ඒකේ ඇත්ත සොයාගෙන ගියහම මේ ඔක්කෝගෙම නිර්මාණකරුවා කවුද? මේ ගෘහය හදන වඩුවා කවුද? එයා තමයි මෝහය නමැති දේ. ඒක නැතිකරන්න පුළුවන් දෙයක්. ඒ මෝහය නැතිකරන්න පුළුවන් වෙන්නේ ඒ මෝහය මෝහයක් බව තේරුම්ගත්තහම යි. එතකොට පුළුවන්කම තියෙනවා, ඒ ධර්මය නැතිකරන්න.

ඉතින් අන්න ඒ නිසා අපි මේ විදර්ශනාව තුළින් අපි මේ විදියට යම්කිසි කෙනෙක් එසේ ධර්ම ටික කොටුකර ගැනීමෙන් ඒ ධර්මයන්ගේ මතුකරගත්තායින් පස්සේ දැන් ඔන්න- ඊට පස්සේ ඊළඟ කාරණාව: ඒකත් වැදගත් කාරණාවක්.

පළමුවෙනි පියවර: දැන් අපි විද්‍යාව උපදවාගෙන, මනුස්සයා කියන අදහස තුළ අපි දැනගත්තා, මේ මනුස්සයා කියන එක ඇත්ත වශයෙන් ම අපට වැටැහිච්චි දේ, නැති දෙයක්. නමුත් එතැන තිබුණේ මෝහය කියන ධර්මතාවයක්. මෝහය සමග ලෝභයක් හටගෙන තිබුනා. ඒ ලෝභයත් එක්ක පල වශයෙන් හටගත්තා රූප-වේදනා-සංඥා-සංඛාර-විඥාන. ඔන්න ඔය ටිකත් දැන් අපි දැක්කා. මනුස්සයෙක් නෑ, ස්කන්ධ ටිකත් දැක්කා.

දෙවැනි පියවර: දැන් මේ ස්කන්ධ ටික අපි ගවේශණය කරළා දෙවැනි පියවර බලනවා. ඔන්න පරමාර්ථ ධර්ම ටික මතුකරගත්තා. මතුකරගෙන, දැන් ඊළඟට එන කාරණාව තමයි, මේ ධර්මයන් කෙරෙහි ඇලෙන්න සුදුසු ද? මේ ධර්මයන් කෙරෙහි ගැටෙන්න සුදුසු ද? මේ ධර්මයන් මම, මගේ කියලා ගන්න සුදුසු ද? ඔන්න දෙවැනි පියවර අපි පරීක්ෂාකරා.

රූපය ගැන බලනකොට මේ රූපය කියන එක ඇත්තට ම අනිත්‍ය වූ, අසාර වූ, දුක් වූ, කිසිම වැඩකට නැති ධර්මයක්. හටගෙන නිරුද්ධවෙන ධර්මයක්. හටගත්ත සැනින් බිඳිලා යන ධර්මයක්. ඒ නිසා එයා හොඳට රූපය ගවේශණය කරනවා.

බුදුරජාණන් වහන්සේ **වීණෝපම සූත්‍රයේ**[3] දේශනා කරනවා, ***එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු රූපං සමනෙ'නසති යාවතා රූපස්ස ගති,*** යම්තාක් මහණෙනි, රූපයේ ගතිය ඇත්තේ ද, ඒතාක් ඔබ රූපය දිහා බලන්නේ. රූපය දිහා බලනකොට එයාට රූපයට මම කියලා කියන්න තියා මේක ලඟටවත් ගන්න සුදුසු දෙයක් නෙවෙයි. බොහෝ දුක් උපද්දවන, බොහෝ ආදීනව තියෙන, බොහෝ කටුක විපාක, කර්ම, කෙලෙස් ඇතිකරන, ධර්මයක් නේ ද කියලා බුදුරජාණන් වහන්සේ උපමාවකින් දේශනා කරනවා. හරියට සැරිසිලා ගමණක් යන මනුස්සයෙක්ගේ ඇඟට, එක පාරට ම දානවා සර්පී කුණක් හෝ මළකුණක් හෝ කුණුවෙච්චි. අර මනුස්සයා මුලු සිතින් ම කලතාගෙන අර සර්පී කුණ ඈතට විසිකරළා දානවා. කෑගහලා, සද්දයකුත් දාගෙන තමයි ඒ සර්පීකුණ විසික්කරළා දාන්නේ. ඒකේ ආයෙ චුට්ටක්වත් තියාගන්න ඕනේ කියන අදහසක්වත් නැහැ.

හැබැයි අපට මේ කෙලේසයකින් මේක හරියට නො දකින නිසා, රූපයේ හරියට නො දැකීම නිසා, මේ මනුස්සයා කියන අදහස - අපි කියමුකෝ ස්ත්‍රියක් කියලා. විරුද්ධ. දැන් මේක අපි දන්නවා. දැන් මේ වැරැදි දෙයක් හටගත්තේ මේක. නමුත් මේක තුළ ලෝභය, රාගය, ඇතිවුණායින් පස්සේ, මේක දුරු කරන්නේ අපි හෙමින්. ඇතුළත නමුත් මේකේ ආයිත් දකින්න ඕනේ තමන්ට ම හොරෙන් ම හෝ බලන්න ඕනේ කියන ඇතුළේ තියෙනවා අදහසක්. ඒක අපි අර සර්පී කුණ සහමුලින් ම විසිකරලා දානවා වාගේ විසිකිරීමක් ඒ අදහස තුළ එන්නේ නැහැ. ඒ නිසා මේවා අපට, අපට

[3] වීණෝපම සූත්‍රය - 2500 බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - සංයුක්ත නිකාය (4) – 374වැනි පිටුව.

දුරුවෙන්නේ නැහැ. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ ඒ අරමුණ අල්ලාගෙන, ඒ අරමුණේ යථාර්ථය දැකලා මුලු හිතින් ම සලකාගෙන මේක බැහැර කරන්න. බැහැර කරන්න නම් එහි සැබෑ ස්වභාවය අපි දකින්න. එහි ආදීනව ස්වභාවය රූපයේ පෙනෙන නිස්සාර ස්වභාවය අපි දකින්න.

ඊළඟ ධර්මය වශයෙන් අපට තියෙන්නේ වේදනාව යි. වේදනාව සැප වේදනා, දුක් වේදනා, උපේක්ෂා වේදනා කියන වේදනා ධර්ම තුනෙන් මාරුවෙන් මාරුවට මේ සිත තුළ තියෙන්න පුළුවන්. අපට ලෝභමූල සිතක් නම් ඒ ලෝභමූල කෙලෙස් උඩ, ලෝභමූල සිත තුළ තියෙන්නේ සෝමනස්ස වේදනාවක්.

මේ ධර්මයේ ඇලෙන්න සුදුසු ද? නෑ. ඒකත් ස්පර්ශය නිසා හටගෙන, හටගත්ත සැනෙන් බිඳිලා යනවා. මේ අපට ඕනෑ ආකාරයකට පවත්වන්න බැහැ. මේක කවදාවත්, කොයි තරම් සැප දෙයක් වුණත්, මේක අපට කවදාවත් මට ඕනෑ විදියට තියාගන්න බැහැ. මගේ ය කියලා බදාගෙන ඉන්න පුළුවන්කමක් නැහැ. මේ සැප වේදනාව උපද්දවාගන්නත් අපට බොහෝ දුක් විඳින්න වුණා. බොහෝ ආදීනව රැසක් තියෙන්නේ. ඒ විතරක් නෙවෙයි, මේ සැප වේදනාව ඇතුළේ මෙන්න මේ කියන රාගානුසය. ලෝභය. අන්තර්ගතවෙනවා. ඒ නිසා මේක ගන්න සුදුසු දෙයක් නෙවෙයි මෙයාට.

මේ විදියට පින්වතුනි, ඔබ ස්කන්ධ පහ වෙන වෙන ම, වෙන වෙනම එකින් එක පරීක්ෂාකරගෙන බලන්න. වේදනාව දියුබුබුලක් වගෙයි. සංඥාව මිරිඟුවක් වගෙයි. මනුස්සයෙක් කියලා අපට වැටැහෙනවා. වැටැහුනාට ඒක පරීක්ෂා කරළා බලාගෙන යනකොට ඒකේ ඇති මනුස්සයෙක් නැහැ. ඒ නිසා මිරිඟුව කියලා කියනවා. මිරිඟුව අපට චතුර වගේ පෙනෙනවා. ලඟට ගිහිල්ලා බලනකොට ඇති චතුරක් නැහැ.

අන්න ඒ වාගේ පින්වතුනි, අපට වැටැහෙන මේ අදහස්, අපට කෙලෙස් උපද්දවාපු මේ අදහස් ටික ගත්තහම, මේ අදහස් සොයාගෙන ගියහම එයාට, "ඇත්තට ම අපි මේ නැති දේකට නේ ද මේ සසර යන්නේ" කියන කාරණාව එනවා. අන්න ඒ විදියට ස්කන්ධ පහ ***සඤ්ඤා මරීචිකූපමා*** - මිරිඟුවක් වාගෙ යි. අපට සංඛාරය කෙසෙල් කඳක් වාගෙයි. මොන තරම් කල් තිබිලා හරි කෙසෙල් ගහ පීදිච්චි ඉවරවෙලා කෙසෙල් ගසක් මුලින් අගින් කපලා, ඒකේ අරටුවක් සොයන්න කියලා පොතු ටික ගලවාගෙන, ගලවාගෙන යනකොට මොනවා ද හම්බවෙන්නේ? කිසිම අරටුවක් නැහැ. පොතු ටිකක් විතර යි හම්බවෙන්නේ. පීදිච්චි නැති කෙසෙල් ගසක් ගැන යි බුදුරජාණන් වහන්සේ පෙන්නන්නේ. පොතු ටිකක් විතරයි හම්බවෙන්නේ. කිසි ම හරයක් නැහැ.

ඒ වාගේ අපි මේ කල්පනා කරන සංඛාරය, මේ 'මනුස්සයා' කියලා වැටැහිච්චි අදහස, කිසිම වැඩකට නැති දෙයක්. නැති දෙයක් හැටියට යන්නේ. විඤ්ඤාණය - ***මායූපමඤ්ච විඤ්ඤාණං*** - මායාවක්. එතැන තිබුණේ සතරමහාධාතු ටිකක්. සතරමහාධාතු ටිකක් තියෙන තැන, අපේ හිතෙන් ම මනුස්සයා කියන අදහසක් අපට ඇතිකරළා දුන්නා. විඤ්ඤාණයේ මායාකාරීබව - අපි හැබැයි මේ විඤ්ඤාණයෙන් ඇතිකරළා දීපු මායාවක් කියලා අපි දැනගෙන හිටියේ නැහැ.

මේ සියල්ල ම පින්වතුනි, **සම්මා විද්‍යා** කියන කාරණාවට තමයි අයත්වෙන්නේ. ධර්මය දන්න කෙනා තමන්ට ඇතිවෙච්චි ඵලය පිළිබඳව ඒ විදියට යි ගවේශණය කරන්නේ.

ඒ නිසා දැන් අපි මේකෙන් මතුකරගත්තා, ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන කාරණාව.

දැන් අපි මතුකරගත්තේ මේ අකුසලයක් පිළිබඳව යි. අවිද්‍යාව නිසා අකුසල් ඇතිවන ආකාරය යි. මොකද, අපට දුරුකළයුත්තේ කුසල් නෙවෙයි. අකුසල් දුරුකළයුත්තේ. එතකොට **අකුසලයේ ශක්තිය තියෙන තාක් කල් තමයි අපි සසරේ යන්නේ**. ඒ නිසා කුසලය අවශ්‍යවන්නේත් අකුසලය ඇතිතාක් පමණ යි. අකුසලය දුරුකළයුතුයි. කුසලය ප්‍රහාණය කිරීමක් නැහැ. කුසලය කියන එක වැඩිය යුතු ධර්මයක්. අකුසලය පහකරයුතු ධර්මයක් හැටියට යි ධර්මයේ පෙන්නන්නේ. **අකුසලය දුරුවුණාම, කුසලය නිරායාසයෙන් ම නැතිවෙලා යනවා.** මොකද මේ කුසලය කියන එක තිබුණේ අකුසල ශක්තිය නැතිකිරීම සඳහා පමණ යි.

අන්න ඒ නිසා අපි ඒක තේරුම්ගන්න ඕන. කුසලය තිබුණාට අපට හානි කරන්නේ නැහැ. ඒ නිසා මෙන්න මේ අකුසලය නැතිකරන්න අපි විද්‍යාව උපදවාගත්තා. දැන් ඒ විද්‍යාව උපදවාගන්න යන වැඩපිළිවෙළ අපි අර්ථ දක්වාගත්තා.

එතකොට විද්‍යාව කියන කාරණාව මතුකරගන්න ඉස්සරෝ ම අපට ඇතිවෙච්චි අදහස තුළ තියෙන්නේ මොනවාද කියලා බැලුවා. එතකොට හම්බවුණා අපට පරමාර්ථ ධර්ම ටිකක්. ඒක තමයි මම අර මුලින් විමුක්ති ද්වාරවල සාකච්ඡාවලදී පෙන්නුවේ, විදර්ශනා භූමිය හැටියට.

නාමරූපපරිච්ඡේද ඤාණය. නාම-රූප ටික ඉස්සරෝම මතුකරගන්න ඕන. මතුකරගන්නේ කුමක් තුළින් ද? අපට ඇතිවෙච්චි අදහස් පදනම්කරගෙන යි. ස්ත්‍රිය, පුරුෂයා, රන් රිදී, මිල මුදල්, යාන වාහන, ඉඩකඩම්, ගේ දොර ආදී මේ විදියට යි අපට වැටැහෙන්නේ. ඒ තුළ අපට පරීක්ෂාකරගෙන යනකොට අපට හම්බවුණා ඒ දේවල් තුළ මෙන්න මෙහෙම ස්කන්ධ පහක් ඇති බව. ඒ තුළ ඇති මෝහය නමැති ධර්මයක් තිබුණා. ඒක පදනම්වෙලා තමයි මනුස්සයා කියන අදහසක් ඇතිවුණේ. ඒ නිසා ලෝභ, ද්වේශ, කම් කෙලෙස් ඇතිවුණා කියලා ධර්ම ටික මතුකරගත්තා. ඒකට අපි කිව්වා

නාමරූපපරිච්ඡේදඥානය කියලා. ඒ ධර්ම ටික හටගත්තේ, මේ මනුස්සයා කියන අදහස හටගත්තේ මෝහය නිසා යි. ඒකට ප්‍රත්‍ය මොනවාද කියලා බැළුවහම, හම්බවෙනවා, මොකක් ද එයාට ප්‍රත්‍යය හම්බවෙන්නේ? මෙන්න මේ කියන රූපයත්, ඇහැත් කියන කාරණාව යි. මේ ඇහැත් රූපයත් ප්‍රත්‍යවෙලා මේ ස්කන්ධ ටික හටගත්තා කියලා ඔන්න දකිනවා.

එතකොට කෙනෙක්ට අදහසක් ඇතිවුණා නෙවෙයි. ඉබේ ම ඒවා හටගත්තා නෙවෙයි. කවුරුවත් මැව්වා නෙවෙයි. මේ හේතු-ඵල දහමකු යි ක්‍රියාත්මක වෙන්නේ. **පච්චයපරිග්‍රහඥානය** ඇතිකරගත්තා අපි. ඊට පස්සේ **නාමරූපපරිච්ඡේදඥානය, පච්චයපරිග්‍රහඥානය** මේ කාරණා දෙක ඇතිකරගත්තු කෙනා, ඊට පස්සේ දෙවැනි පියවර වශයෙන් එයාට හම්බවෙනවා, ඇත්තට ම මේ ධර්ම ටික නම් හටගත්තේ, මේ දේවල්වලට ඇලිය යුතු යි ද කියලා දෙවැනි පියවරේ බැලුවහම, එතකොට එයා මේ ප්‍රත්‍යයෙන් හටගත්තු ධර්මයන් විමසාගෙන, විමසාගෙන යනකොට යි අපට තේරුණේ, මේවා පයින්වත් පාගන්න සුදුසු දේවල් නෙවෙයි. කකුලෙන්වත් ස්පර්ශ කරන්න සුදුසු දේවල් නෙවෙයි. මේවා දුරින් ම දුරුකළයුතු ධර්මයෝ යි. අනාදිමත් කාලයක් අපි සංසාරයේ බැන්දේ, ජරා-මරණ දුක් ඉපැද්දුවේ මෙහෙම ධර්මයන්ගෙන් නේ ද. ඒ නිසා මේවා දුරින් ම දුරුකළයුතු ධර්මයන් කියලා අවබෝධ වෙන්නේ බුදුරජාණන් වහන්සේ දේශනා කරපු නිසා නෙවෙයි, ඒ දේශනාව පදනම්කරගෙන, ඒ ධර්මයන් ම අපි ගවේශණය කරා. එතකොට යි අපට තේරුණේ මේවා කිසි වැඩකට නැති ධර්මයෝ කියලා.

අන්න ඒ තුළ මේවා අනිත්‍ය ධර්මයෝ, අනාත්ම ධර්මයෝ, දුක් වූ ධර්මයෝ කියලා ත්‍රිලක්ෂණයක් අපට හම්බවෙනවා. මේ ත්‍රිලක්ෂණය තුළ නැවැත නැවැත, නැවැත නැවැත විදර්ශනා කරගෙන යනකොට තමයි අපට මේ මෝහය නමැති ධර්මය දුරුවෙලා මාගී චිත්තයක් උපදින්නේ. මාගී සිතක් ඉපදුනා.

මේ මාඟී සිත උපදින්නත් මේ කියන අවිද්‍යාව, අවිද්‍යාව ප්‍රත්‍යවෙලා තියෙනවා උපනිශ්‍රය ප්‍රත්‍යයෙන්. අවිද්‍යාව කියන ධම්තාවයක් නො තිබුණා නම්, මාඟීයක අවශ්‍යතාවයක් නැහැ.

ඒ නිසා අවිද්‍යාව කියන එක මේ මාඟී සිත උපදින්න බලවත් ලෙස උපකාරයක් වෙලා තියෙනවා.

- ඒ නිසා කියනවා ප්‍රණ්‍යාභිසංඛාරයට අවිද්‍යාව උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙනවා කියලා කියනවා.

ඉතින් ඒ නිසා මේ කාරණාව තමයි මට මතක්කරන්න ඕනෑකම තිබුණේ. මේ ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන කාරණාව ප්‍රත්‍ය ප්‍රත්‍යුප්පන්න ධම්යන් ගවේශණය කරන්න ඕන. ප්‍රත්‍ය කියන එක, ප්‍රත්‍ය කියන ධම්යේ සැබෑවට ම ඇති දෙයක් වෙන්නත් පුළුවන්. නැති දෙයක් වෙන්නත් පුළුවන්. නමුත් ප්‍රත්‍යයෙන් හටගත්ත ධම් ටික ඇති දේවල්. හටගත්තු ධම් ටික ඇති දේවල්. ඒවා අපි මතුකරගත යුත්තේ. ඒ නිසා ප්‍රත්‍යයට යි අපි රැවැටුණේ. දැන් අරමුණට නේ රැවැටෙන්නේ. ඒ නිසා අරමුණ පදනම්වෙළා හටගත්ත දේ හා අරමුණු. එතකොට අරමුණේ හැටි බලන්න යි අපට තියෙන්නේ. එතකොට ඒක බලනකොට යි අපට තේරෙන්නේ මනුස්සයා කියන අදහස ගවේශණය කරළා බලනකොට එයාට හම්බවෙන්නේ කුණප කොටස් ටිකක්. කුණප කොටස් ටිකක් හම්බවෙනවා. එහෙම නැතිනම් සතරමහාධාතු ටිකක්. ඔන්න ඔය කාරණාව තමයි අපි මේ ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන කාරණාව තුළින් එක සන්ධියක් තියෙනවා. මම විස්තර කළේ මේ හේතු-ඵල සන්ධිය යි. හේතු ටික තමයි අපි කතා කරේ. ඵල ටික තමයි දැන් ඊට පස්සේ දැන් මෙතැන හේතු-ඵල සන්ධියේ දී, අවිද්‍යාව-සංඛාර කියන මේ ටික ඔක්කෝම හේතුවෙලා, විඤ්ඤාණ-නාමරූප කියන ඵල ටිකක් අපට ප්‍රතිසන්ධි සිතක් ඇතුලු මේ ඵල සිතක් උපදින්නේ හේතු ටිකෙන් ම යි.

මෙතැනින් නවත්වන්න පුළුවන්. සන්ධියක් තියෙනවා. මේකෙන් අපට මිදෙන්න මාර්ගයක් උපදවාගන්න පුළුවන් තැනක් මේක. එතකොට ඒ මාර්ගය උපදවාගන්න පුළුවන්වෙන්නේ මේ හේතු ධර්මයන්ගේ අතරට විද්‍යාව කියන කාරණාව උපදවා ගැනීමෙන්, මේ ඵල ධර්මය ඇති නොවෙන විදියට, ප්‍රතිසන්ධියක් ඇති නොවෙන විදියට, අපට කටයුතු කරගන්න පුළුවන්කමක් තියෙනවා.

එතකොට ඒ සන්ධිය කියන මේ පටිච්චසමුප්පාදය අපට අවබෝධ කරගන්න පුළුවන් තැනක් මේක. ඵලය කියන ජාතිය නැතිකරගන්න, නිරුද්ධකරගන්න පුළුවන් අවස්ථාවක් මේක. ඒ නිසා මම මෙතැන මේ සන්ධියක් මෙතැන දී අපි කතාකරමු. හොඳයි දැන් ඉතින් ඉතිරි පියවරට යමු අපි.

ඊළඟට අපට කතාකරන්න තියෙන්නේ මේ අවිද්‍යාව වෙලා අපුඤ්ඤාභිසංඛාර ඇතිවෙන එක පිළිබඳවයි. ඒකෙදී, ඔන්න දැන් අපි අපුඤ්ඤාභිසංඛාරයේ අවිද්‍යාවෙන් මුලාවෙලා, ඉන්න කියනවා. අවිද්‍යාව නිසා අකුසල් ඇතිවෙන ආකාරය යි, දැන් අපි කතාකරන්නේ. මේ දක්වා අපි කතාකරගත්තේ පුඤ්ඤාභිසංඛාරයන් ඇතිවෙන ආකාරය හා ඒක තුළින් අපි මේ හේතු-ඵල ධර්මයන් සම්බන්ධකරගන්නේ කොහොම ද කියන කාරණාව යි. දැන් ඊට පස්සේ මේ මාතෘකාව අද අපි අවසන්කරන්න ඕන නිසා මම මේකත් කතා කරනවා.

එතකොට අපුඤ්ඤාභිසංඛාරය: ඒක අපට ප්‍රකට යි. අවිද්‍යාව කියන කාරණාව නිසා අපි අකුසල් ඇතිකරගන්නවා කියන කාරණාව, සතුන් මරණවා, සොරකම් කරනවා, කාමයෙහි වරදවා හැසිරෙනවා කියන කාරණාව අපි දන්නවා. නමුත් ප්‍රත්‍යවීම පිළිබඳව යි, ප්‍රත්‍ය ශක්තිය පිළිබඳව යි මෙහි දී මම කතාකරන්න බලාපොරොත්තු වෙන්නේ.

අවිද්‍යාව තුළ අකුසලයට ප්‍රත්‍යවෙන්නේ කොහොම ද කියන කාරණාවයි කතාකරන්න බලාපොරොත්තුවෙන්නේ. එතකොට අවිද්‍යාව ප්‍රත්‍යවෙන්න පුළුවන් *අපුඤ්ඤාභිසංස්කාරයනට*

අනේකාකාරයෙන් ප්‍රත්‍යවෙන්නේ මෙසේ යි. අපුඤ්ඤාභිසංඛාරයට මේ අකුසලයට අවිද්‍යාව අනේකාකාරයෙන් ප්‍රත්‍යවෙනවා. එතකොට *අවිද්‍යාව අරමුණු කොට, (රාග-දිට්ඨි-විචිකිච්ඡා-උද්ධච්ච-දෝමනස්ස යන මොහු අවිද්‍යා සම්ප්‍රයුක්තයහ.) රාගාදීන් උපදනා කල්හි අවිද්‍යාව ආලම්බනප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.* අවිද්‍යාව අරමුණු වෙලා, රාග-දිට්ඨි-විචිකිච්ඡා-උද්ධච්ච-දෝමනස්ස යන මේවා අවිද්‍යාව හා සම්ප්‍රයුක්තව යෙදෙනවා.

රාගය හෝ දිට්ඨිය හෝ විචිකිච්ඡාව කියලා සිතක් ඉපදුනොත් ඒ සිතේ අවිද්‍යාව සම්ප්‍රයුක්තව ම - එකටම - යෙදිලා තියෙනවා. රාගාදීන් උපන් කල්හි අවිද්‍යාව ආලම්බන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙනවා. අවිද්‍යාව නමැති ධර්මය අරමුණුවෙලා මේ රාගය, දිට්ඨිය, විචිකිච්ඡාව, උද්ධච්චකුක්කුච්චය යන මේ දේවල් කෙලෙස් අකුසල් සිත් උපදින්න පුළුවන්. හැබැයි ඒ උපදිනකොට අර විදියට නොයෙදී නොවෙයි ප්‍රත්‍යවුනේ. අවිද්‍යාව යෙදිලාමයි ප්‍රත්‍යවුනේ. සම්ප්‍රයුක්තභාවයෙන් ප්‍රත්‍යවෙලා, කියලා මෙතැන සඳහන්වෙනවා.

රාගාදිය ගරුකොට ආස්වාදනය කරන කල්හි ආලම්බනාධිපති - ආලම්බන උපනිශ්‍රය වශයෙන් ප්‍රත්‍ය වේ. මේවා වෙනම විග්‍රහකරගතයුතු කාරණා යි. නමුත් මම කෙටියෙන් කියන්නම්: **ආලම්බනාධිපති** කියලා කියන්නේ අරමුණක තියෙනවා බලවත් ලෙස සිත් උපදවන්න පුළුවන් ගතියක්. ගිය සැරේ මම ඒක කිව්වා. ඇතැම් අරමුණු තියෙනවා, සිත් උපදිනවා. නමුත් ඒවා ඒ තරම් අපේ සිතට බලපෑමක් කරන්නේ නැහැ. යම් අරමුණක් තුළ ප්‍රබල බලපෑමක් කිරීමේ හැකියාවක් ඒ අරමුණ තුළ තියෙනවා නම්,

- අපි ගල් කැටයක් දකිනවා. ඒත් සිතක් ඉපදුනේ.
- අපි මැණිකක් දකිනවා. ඒත් සිතක් ඉපදුනේ.

- කෙනෙක් ගල්කැටයට මැණිකක් කියලා රැවැටිලා ඒක දිහා බලනවා. ඒත් සිතක් උපදින්නේ.

එතකොට එතැන දී මැණිකක් කියන සම්මුතියේ, ඒක අරමුණු වෙනකොට එයාට සිතට ලොකු බලපෑමක් කරනවා. ඒ ප්‍රත්‍යයට කියනවා ආලම්බනාධිපති වශයෙන් ප්‍රත්‍යවුනා කියලා. අරමුණේ බලවත්වීම් වශයෙන් ප්‍රත්‍යවුනේ.

ඒ වාගේ තමයි මේ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ඒ වාගේ අරමුණුවෙලා, රාගාදීය උපදිනකොට ඒක අරමුණ බලවත් ලෙස ප්‍රත්‍යවීමක් වෙනවා අරම. ප්‍රත්‍යවෙලා තමයි අපට රාග සිත උපදින්නේ. දිට්ඨිය උපදින්නේ. සමහරවිට තරහක් උපදින්න පුළුවන්. මේ විදියට ප්‍රත්‍යවෙනවා.

ඊට පස්සේ අවිද්‍යාවෙන් මුලාවෙලා ප්‍රාණඝාත ආදිය කරනවා. මුලාවෙලා සතුන් මරණවා, බොරු කියනවා, සොරකම් කරනවා අපි මේ දේවල් වෙනවා. ඒ වෙන කොට අවිද්‍යාව උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ද ප්‍රත්‍යවෙනවා. ඒ කියන්නේ සතුන් මරළා පුරුදු කෙනාට සතෙක් දකින කොට ඒ සතා කොහොම හරි මරන්න ඕනේ කියලා බලවත්ව සිත් උපදිලා ඒ ප්‍රාණඝාතය කරන්නේ සතුන් මරළා තියෙන නිසා යි. ඒ නිසා ඒක උපනිශ්‍රය වශයෙන් ප්‍රත්‍යවෙනවා. ඒ කියන්නේ නිශ්‍රය වෙලා තියෙනවා නේ. එයාට හුරුවක් තියෙනවා ඒ තුළ. ඒ සතුන් මරළා ඇතිබව කියන එක නිසා එයා බොහෝ ප්‍රාණඝාතාදී අකුසල් කරනවා.

හැබැයි, එහෙම නැතිකෙනාට නැහැ. එහෙම උපනිශ්‍රයක් නැති කෙනාට කවදාවත් එහෙම ප්‍රාණඝාතයක් කරන්න හිතෙන්නේ නැහැ. අද අපි ගත්තහම අපි මේ සිල්වත්වෙලා මේ ධර්මාගීයේ යනකොට අපට කවදාවත් මදුරුවෙක්වත් මරන්න හිතෙන්නේ නැහැ. ඒ අනික් පැත්තට උපනිශ්‍රය වෙනවා, යහපත් පැත්තට. එතකොට ඒක **අනන්තර උපනිශ්‍රය, සමනන්තර උපනිශ්‍රය, ආසේවන, නත්ථි** ආදී ප්‍රත්‍යවලින් ප්‍රත්‍යවෙනවා.

යම්කිසි අකුසලයක් කරන කොට ඒ අකුසලය හේතු ප්‍රත්‍යයෙන් **සහජාත, අඤ්ඤමඤ්ඤ, නිශ්‍රය, සම්ප්‍රයුක්ත, අත්ථි, අවිගත** කියලා ප්‍රත්‍ය ශක්තීන්ගෙන් ප්‍රත්‍යවෙනවා කියලා කියනවා. ඒක ඔබට නො තේරෙන කාරණාවක් වෙන්න පුළුවන්. ඒ නිසා මේ අකුසලයක් උපදින්න අවිද්‍යාව ප්‍රත්‍යවන ආකාරයත්, ශක්තිය ඒකට ශක්තිය යෙදෙන්නේ කොහොම ද යන බවත් මම කෙටියෙන් කියන්නම්.

හේතු කියලා කියන්නේ, එතැන හේතුප්‍රත්‍ය කියලා කියන්නේ, ඒ හිතේ යෙදෙන ලෝභ-දෝෂ-මෝහ කියන හේතු යි. ගසක් නො සෙල්වී සිටින්න මුල ගසට උපකාර කරනවා. ඒ වාගේ යම් අකුසල් සිතක හටගත්තු හේතු ටික, ලෝභය, ද්වේශය, මෝහය නමැති හේතු ටික, ඒ හිත බලවත්වෙලා, ප්‍රබලවෙලා, එයාට නැවත නැවත ඒ සන්තානය තුළ එබඳු සිත් උපද්දවනවා. සතර අපායට පත්කරනවා. හේතු කියන ධර්මතාව දුක උපද්දවන්න හේතුවුණා. එබඳු ශක්තියක් මේ හිත තුළ තිබුනා. ඒකට තමයි හේතු ප්‍රත්‍යය කියලා කියන්නේ. එතකොට මේ හේතු ප්‍රත්‍යය වුනේ, අවිද්‍යාවෙනු යි.

මම මුලින් කිව්වා එක ම ධර්මය විවිධ ආකාරයෙන් ප්‍රත්‍යවෙන්න පුළුවන් කියලා. ඒ ප්‍රත්‍යවීම තමයි දැන් මේ ඔබට පෙන්නන්නේ. මම අර කිව්වේ, එක ම ප්‍රත්‍යය විවිධ ආකාරයෙන්:

- වස්ත්‍රය කියන කාරණාව කෙනෙකුගේ රූප ශෝභාව ඇතිකරන්නත් හේතුවෙනවා.
- වස්ත්‍රය කියන කාරණාව කෙනෙකුට රාගයක් උපදින්නත් හේතුවෙනවා.
- වස්ත්‍රය කියන කාරණාව කෙනෙකුට ද්වේශයක් උපදින්නත් හේතුවෙනවා.
- වස්ත්‍රය කියන කාරණාව කෙනෙකුට සීත නසාගන්නත් හේතු වෙනවා.

- වස්ත්‍රය කියන කාරණාව තව කෙනෙකුගේ අලංකාරය පිණිස හේතු වෙනවා.

මේ විදියට එක ම වස්ත්‍රය විවිධ ආකාරයෙන් හේතු වෙනවා.

ඒ වාගේ, එක ම අවිද්‍යාව නමැති ධර්මය හේතුභාවයෙන් ද ප්‍රත්‍යවෙනවා. සහජාත කියලා කියන්නේ, ඒ සිතේ ම එකට උපදින පෙර නො තිබී ම, දැන් අකුසල් සිතක් උපදිනකොට ඒ සිත ඉපදුනේ අවිද්‍යාව නිසා නම් අවිද්‍යාව ඒකේ සහජාතව කියලා කියන්නේ, එකට ම උපදිනවා. එකට ම උපදිනවා. සහජාතව කියලා කියනවා.

එහෙම ප්‍රත්‍යවීමකුත් තියෙනවා. අවිද්‍යාව සහජාතව නො ඉපදුනා නම්, ඒ සිත අකුසල් සිතක් වෙන්නේ නැහැ. දැන් අවිද්‍යාව නිසා අකුසලයක් උපදින කොට, අපි කියමු ප්‍රණඝාතයක්, බොරුවක් කියනවා කියන සිද්ධිය වෙන කොට, බොරුව කියන එක සිත මුලින් ඉපදිලා, ටිකක් වෙලා ගිහින් අවිද්‍යාව කියන කාරණාව උපදින්නේ නැහැ. ඒක එකටම යි උපදින්නේ. එහෙම නො වුණා නම් ඒ සිත උපදින්නේ නැහැ. ඒක තමයි එතැන ප්‍රත්‍යභාවය අපි තේරුම්ගන්න ඕනේ. ප්‍රත්‍ය ශක්තිය.

අඤ්ඤමඤ්ඤ ශක්තිය කියලා කියන්නේ ඔවුනොවුන්ට උපකාර කරගන්නවා. ලෝභය යි මෝහය යි එකතුවෙළා නම් අපි බොරුකීම කියන කාරණාව කරේ, ලෝභය මෝහයට උපකාර කරළා, මෝහය ලෝභයට උපකාර කරළා, මේ දෙක වේදනාවට උපකාර කරළා, සංඥාවට උපකාර කරලා, ඔවුනොවුන්ට අඤ්ඤමඤ්ඤව උපකාර කරගන්නවා. කෙලින් අතට කෝටු තුණක් තියලා තිබුනොත් මුහුණට මුහුණ හිටින්න, මේ තුණ ඔවුනොවුනට උපකාරකරගෙන ප්‍රත්‍යවෙලා තමයි ඒක නො වැටී තියෙන්නේ. අන්න ඒක තමයි අඤ්ඤමඤ්ඤභාවය. නිස්සය භාවය කියලා කියන්නේ ඒක ඇසුරුකරගෙන පවතිනවා.

ඉතින් මේකෙන් මම අද කතාකරන්න උත්සාහවත්වුණේ මේ ප්‍රත්‍ය අපි එකින් එකට කතා කරමු. ආසේවන ප්‍රත්‍යය කියන එක අපට බොහෝම වැදගත් ප්‍රත්‍යයක්. මේක ගැන අපි දැන් මේ අකුසලයත් එක්ක කතාකරන්න මට උවමනාව තිබුනා. ආසේවන ප්‍රත්‍යය කියන එක අපට බොහෝම සමීප ප්‍රත්‍යයක්. කුමක් නිසා ද? මේ අප තුළ, අපි ජීවත්වෙන කොට අපි දකින අහන සිද්ධීන් තුළ අපිට ඇතිවෙනවා සිත්. කුසල්-අකුසල් සිත් ඇතිවෙනවා. දැන් අපි කියමුකෝ රූපයක් දැක්කහම ඒක අරමුණු කරගෙන ලෝභ සිතක් උපදිනවා. **ඒ ලෝභ සිත ඉපදිච්චි පමණකින් ඒක අපට අපායේ ප්‍රතිසන්ධි දෙන්න හේතුවෙන්නේ නැහැ. එහෙම හේතුවෙනවා නම් කිසි කෙනෙක් සුගතියේ යන්නේ නැහැ.** ඔය බොහෝ ලෝභ මූල සිත් අපට ජීවිතය තුළ උපදිනවා. හැබැයි ඒ ලෝභමූල සිත, කම්පථයක් බවට පත්වුණහම තමයි ප්‍රතිසන්ධි විපාක ගෙනැත් දෙන්නේ. කම්පථයක් බවට පත්වෙන්නේ මෙන්න මේ කියන ආසේවන ප්‍රත්‍ය ශක්තිය නිසා යි. ඒ නිසා අප තුළ අකුසල කම්, කම් පථ බවට පත්වෙලා කම් රැස්කරගෙන, ඒ දේවල් අපට සිතෙන් අයින්කරගන්න බැරි තත්ත්වයකට පත්වෙන ප්‍රත්‍ය ශක්තියක් තියෙනවා. අන්න ඒක තමයි අපි තේරුම්ගන්න ඕන. ඒක තේරුම්ගන්න එක ඉතාමත් ම වටිනා සිද්ධියක්.

මේ දේශනාව ඔබ ක්‍රමානුකූලව අහගෙන ආවානම්, ඒක ඔබට සප්පායවෙයි. නැතිනම් ඉතින් මේවා ටිකක් අපහසු වෙයි. මේවා ක්‍රමානුකූලව හරියට ශ්‍රවණය කරන්න ඕන. මගින් මගින් මේ දේශනාව ශ්‍රවණය කරන කොට අතහැරෙනවා. මේක ගැලැපීමක් එක්ක කරන කතාවක්.

දැන් මේ මම මේ ආසේවන ප්‍රත්‍යය කියන්න ඉස්සෙල්ලා ඒකේ ප්‍රයෝජනය වණ්ණනා කළේ, ඒක බුදුරජාණන් වහන්සේගේ දේශනා විලාශයක්. යම් ධර්මයක් කියන්න යනකොට ඒක ගැන, ඒකේ වටිනාකම ගැන කිව්වොත් ඒක හොඳට ගන්නවා. මනුස්සයෙක් කම්බිලි වස්ත්‍ර

විකුණනකොට, අටුවාවේ පෙන්නන්නේ, නිකම්ම “වස්ත්‍ර ගන්නවා ද, වස්ත්‍ර ගන්නවා ද“ කියලා පාරේ කියාගෙන ගියාට මිනිස්සු ඒකට ඇහුම්කන් දෙන්නේ නැහැ. “රන් කම්බිලි, රන් කම්බිලි, රන් වස්ත්‍ර, රන් කම්බිලි“ කියලා කියාගෙන ගියොත් ඒකට විශේෂණයක් දුන්නා. එතකොට මිනිස්සු අන්න ඇවිල්ලා ගන්නවා කියනවා.

ඉතින් අන්න ඒ වාගේ, මේ ආසේවන ප්‍රත්‍යය ඇයි අපි ඉගෙනගතයුත්තේ? මේක නිසා තමයි අපට කම් සකස්වෙන්නේ. අපි භාවනා කරනකොට ඒ භාවනාව තුළ ඇතැම් දේවල් තියෙනවා, අපට අයින්කරගන්න බැහැ. අයින්කරගන්න බැරි ඒවා තියෙනවා. අපි විදර්ශනාව කරාට නැවැත නැවැත සිහිවෙවී එනවා. ඒවා කම් බවට පත්වෙලා, මැරෙණකොටත් මේවා සිහිවෙළා අපි අපායට යන්න පුළුවන්. මෙන්න මේ කම් ප්‍රත්‍යය ශක්තිය.

අපි කතා කරමු දැන්. ඒකට මම **පට්ඨානප්‍රකරණය** තමයි මෙතැන්ට ආදේශ කරන්නේ. අපට ඒවා මනාකොට විග්‍රහකරන්න වෙන තැන් නැහැ. සූත්‍ර පිටකයේ මේවා හම්බවෙන්නේ නැහැ. නමුත් මේවා මම ඔබට පෙන්නන්නේ මෙහෙම සිද්ධාන්ත වෙනවා. එහෙම ප්‍රත්‍යයෙන් වෙනවා. මේවා තේරුම් දැනගැනීමෙන් අපට ලොකු අවබෝධයක් කරා යන්න පුළුවන්. හැබැයි සූත්‍රය විතරක් පරිශීලණය කරන කෙනාට මේ ධර්ම රසය හම්බවෙන්නේ නෑ. අන්න ඒ නිසා අපට එහෙම වීමක් තියෙනවා නම් ඒක අපි ප්‍රතික්ෂෙප නොකළ යුතුයි. ඒ නිසා ආසේවන ප්‍රත්‍ය පිළිබඳව මේ පොතේ තියෙන විදියට කතා කරමු. මේක පටඨානප්‍රකරණයේ සූවිසි ප්‍රත්‍යය යටතේ හම්බවෙන දොළොස්වන ප්‍රත්‍යය යි. ආලම්බණ ප්‍රත්‍යය, අධිපති ප්‍රත්‍යය ආදී විසිහතරක් තියෙනවා.

“*යම්කිසි වස්තුවක කලින් ගල්වා තිබෙන සායම එය මතුයෙහි නැවත ගල්වන ඒ වර්ගයේ සායමට පැහැපත් වීමට*

උපකාර වන්නාක් මෙන් අනතුරුව උපදනා තමාගේ ජාතියේ සිත තමාගේ කුශලාදී ස්වභාවය ගෙන, වඩා බලවත් වීමට උපකාර වන සිත ආසේවන ප්‍රත්‍යය යි". එතකොට මම කිව්වා, මේ ආසේවන ප්‍රත්‍යයේ, යම්කිසි වස්තුවක කලින් ගල්වා තිබෙන සායම, එය මතුයෙහි නැවත ගල්වන ඒ වගීයේ ම සායමකට - (මෙන්න මේවා හරි වැදගත්. අපි බොහෝවිට මේවා කියවන කොට අපට ඒවා පැහැදිළි වියයුතු තැන්, ඒ කියන්නේ අවධානය යා යුතු තැන් අවධානයට යන්නේ නැහැ.) - උපමාවක් පෙන්නන්නේ: දැන් මේකේ තියෙනවා යම්කිසි වස්තුවක මුලින් ගල්වලා තියෙන සායමක්, ඒක අපි කියමුකෝ අපි ඉරක් ඇන්දා කියලා. ඒක ඒ උඩම නැවත ගල්වන ඒ වගීයේ ම, ඒ වගීයේ ම, ඒ වගීයේ ම සායමකට පැහැපත්වීමට උපකාරවන්නාක් මෙන්, අර පැහැය ඒ වගීයේ ම එකක් ගැවොත් ඒ පැහැය තවත් වැඩිවෙනවා. --*-උපකාර වන්නා සේ,* ඒ විදියට *අනතුරුව උපදනා තමාගේ ම ජාතියේ සිත* - ඒක මුලින් අකුසල් සිතක් ඉපදිලා ඒ ජාතියේ ම, අකුසල් සිතක්, ඒ ස්වභාවයේ සිතක් ඉපදුණොත් ඒ සිත, ඒ කියන්නේ දෙවෙනි පාර ඉපදිච්ච සිත, බලවත්වීමට මුලින් ඉපදිච්ච සිතේ උපකාරයක් තියෙනවා.

ඒ නිසා තමයි වඩා බලවත්වීමට උපකාරවන සිත ආසේවන ප්‍රත්‍යය යි. ඒ නිසා මේකට අපි, මේකේ විග්‍රහ වාක්‍යය ධම්මයේ සඳහන්වෙන්නේ, ***පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයො.*** මුලින් මුලින් හටගත්තු අකුසල සිත පසුව පසුව උපදින ඒ වගීයේ ම අකුසල් සිතට ආසෙවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙලා, ඒ අකුසල් සිත බලවත්වෙනවා. ඒ නිසා අපට ලෝභයක් ඉපදුණොත් බොරුවක් කියන්න ඕන කියලා, මේක නැවත නැවත ඉපදිලා, ඉපදිලා කම්පථයක් බවට පත්වෙලා, ප්‍රතිසන්ධිවිපාකයක් ගෙනැත් දෙන තත්ත්වයට පත්වුණේ මෙන්න මේ ආසේවන ශක්තිය තියෙන නිසා යි. ඒ නිසා බොහෝ අය මේ කළ අකුසල් පිළිබඳව නැවැත නැවැත බයට හරි, නො දන්නාකම නිසා හරි නැවැත නැවැත

සිහිකිරීම නිසා ඒ සිතීමේ ආසේවනප්‍රත්‍ය ශක්තිය පදනම්වෙලා කම්පඨයක් බවට පත්වෙනවා.

මේක හරි ලස්සන යි විග්‍රහය. අපි ඉදිරියට කරගෙන යමු.

තමාගේ ස්වභාවය අනන්තර චිත්තයට දෙන බව හා අනන්තර චිත්තයට තමාගේ ස්වභාවය ගන්වන බව ආසේවන ශක්තිය ය. - ඒ, ප්‍රත්‍ය ශක්තිය තමයි අපි තේරුමගන්න ඕන. ප්‍රත්‍යය හා ප්‍රත්‍ය ශක්තිය.

අපි මුලින් කතා කරා මේක ගැන. ඉතින් මේවා අපේ දැන් ඔලුවට එන්න ඕනේ.

එතකොට තමාගේ ස්වභාවය - කියලා කිව්වේ, දැන් මේ තමා කියලා කිව්වේ මොකක් ද? මුලින් හටගත් බොරුකීමේ චේතනාව පදනම්වෙලා ඔන්න අපට අකුසල් සිතක් ඉපදුනා. එතකොට තමාගේ ස්වභාවය *අනන්තර චිත්තයට* -ඒ වාගේ ම බොරුකීමේ චේතනාව නැවැතත් අලුත් සිතක උපදිනවා. ඒ දෙවැනිවර ඉපදිච්චි සිතට, *අනන්තර චිත්තයට දෙන බව හා අනන්තර චිත්තයට තමාගේ ස්වභාවය ගන්වනබව,* අර මුලින් ඉපදිච්චි බොරු කීමේ අදහස නැවතත් ඒ සිත අපට සිහිවෙනකොට මේ නැවත සිහිවෙච්චි සිතට අර මුලින් සිතේ ස්වභාවය ගන්වනවා. එහෙම ශක්තියක් තියෙනවා. ඒක තමයි මේ ආසේවන ප්‍රත්‍ය ශක්තිය කියලා කියන්නේ. ආසේවන ප්‍රත්‍ය ශක්තිය.

එහෙම වීම් තියෙනවා. අපට එක පාරක් දෙකක් සිහිවුනාට නැවත ඒක අපට වද දෙන්නේ නැහැ. නමුත් ඒ සිතම නැවැත නැවැත අපි සිහිකරොත් - මේ තමයි භාවනාවේ අපි කියන්නේ ඒ මොනවාහරි දෙයක් ඔස්සේ අපි ගියොත් ඒක අපට අයින්කරගන්න අමාරුයි කියන්නේ මෙන්න මේ ප්‍රත්‍ය ශක්තිය ක්‍රියාත්මක වෙන නිසා යි. ඉතින් මේක තේරුම්ගත්තහම අපි ඒ නිසා අපි වෙච්චි වැරැදි හෝ අකුසල් හෝ මේවා නැවැත සිහිවෙන කොට එතැන අපි විද්‍යාව

උපදවාගන්න ඕන. විද්‍යාව උපදවාගෙන මේක නැවැත නැවැත අපගේ සිතේ ආසේවන වන ගතිය වළක්වාගන්න ඕන.

ඒ නිසා ප්‍රත්‍ය ශක්තිය කියන්නේ අන්න ඒ අර මුලින් ඉපදිච්චි සිතේ ගතිය දෙවැනි සිතට දෙනවා. උදාහරණයක් වශයෙන් අපි කියමුකෝ මුලින් අපි යම් ශිල්පයක් ඉගෙනගන්නවා. අපි උගත්කමක් සම්බන්ධයෙන් මොනවා හරි දෙයක් ඉගෙනගන්නවා කියමුකෝ. ඒක නැවැත නැවැත ඉගෙනගන්න කොට මුලින් මුලින් ඉගෙනගත්තු ශිල්ප ආදිය පසුව පසුව උපදින දේවල්වලට උපකාර වෙනවා. දහයේ පන්තියේ දී පුහුණුවෙච්චි දේ එකොළහේ පන්තියේ යනකොට උපකාරයක් වෙනවා. ඒ උපකාරබව නැවැත, නැවැත මතක්කිරීමෙන්, සිහිකිරීමෙන් උපකාර ශක්තියක් තියෙනවා. ඒක ආසේවන ප්‍රත්‍ය ශක්තිය කියලා කියනවා. මේක ක්‍රියාත්මකවෙන අන්තර්ගතයක් තියෙනවා. ඒක අපි හොඳට ඉගෙනගන්න ඕන.

එතකොට අපි බලමු: *තමාගේ ඒ ස්වභාවය අනන්තර චිත්තයට ගැන්වීමේ ශක්තිය ඇත්තේ ද අතීත චිත්තයේ ස්වභාවය ගෙන වඩා බලවත් වීමේ ශක්තිය ඇත්තේ ද උත්සාහයෙන් යුක්තවන බලවත් චිත්තයන්ට ය.* අන්න එතකොට මේක හැම හිතකම තියෙන එකක්. චක්ඛු විඤ්ඤාණ සිතේ නැහැ එහෙම ගතියක්. එතකොට තමාගේ ස්වභාවය දෙවැනි සිතට දෙන්නේ එහෙම නැතිනම් නිරුද්ධවෙච්චි අතීත සිත ඒ වර්ගයේ ම වර්තමාණ සිතක් ඉපදුනහම, අර අතීත සිත, වර්තමාන සිතට ඒ ප්‍රත්‍ය ශක්තිය දෙන්නේ බලවත් සිත්වල පමණයි. එතකොට බලවත් සිත් කිව්වේ කුසල් හෝ අකුසල් සිත්. හේතු යෙදිච්චි සිත්. ලෝභය, ද්වේශය මෝහය පදනම්වෙලා *තමාගේ ඒ ස්වභාවය අනන්තර චිත්තයට ගැන්වීමේ ශක්තිය ඇත්තේ ද අතීත චිත්තයේ ස්වභාවය ගෙන වඩා බලවත් වීමේ ශක්තිය*

ඇත්තේ ද උත්සාහයෙන් යුක්තවන බලවත් චිත්තයන්ට ය. ඔවුහු නම් ජවන චිත්තයෝය.

ජවන් සිත් කියලා මෙතැන පෙන්නන්නේ, -අභිධර්මය ඉගෙනගන්නකොට තේරෙනවා.- ඒ කියන්නේ කුසල් සිත්වලට ම යි ජවන් සිත් කියන්නේ. *අජවන චිත්තයෝ දුබලයෝය.* අජවන චිත්තයෝ කියලා කියන්නේ අර හේතු ධර්මයෝ යෙදිච්චි නැති සිත්. ඒවා දුබලයෝ යි. *ඔවුහු තමාගේ ස්වභාවය අනන්තර චිත්තයනට ගැන්වීමට සමත් නොවෙති.* - ඒ කියන්නේ අපි රූපයක් දැකලා නැවතත් ඒ රූපය දකිනකොට ඒකේ කුසල් අකුසල් ඇතිවුණේ නැතිනම්, අර මුලින් දැකපු දැකීම දෙවැනි දැකීමට බලවත් වෙන්න විපාක සිතට එහෙම බලවත්වීමට උපකාර කරන්නේ නැහැ. *අතීත චිත්තයේ ස්වභාවය ගැනීමට ද සමත් නොවෙති.* එතකොට ඒ දුබල චිත්තයන්ට අර අතීතය සිහිකරන්න පුළුවන් හැකියාවකුත් නැහැ.

දිටෙඨ දිටඨමත්තකං දැකීම දැකීම පමණක් වුණොත් එයා දැකපු දේ කියලා හොයාගෙන යන්න හැකියාවක් ගොඩනැගෙන්නේ නැහැ කියලා මෙතැන කියන්නේ ඒක යි. *ඒ වාගේ ම ලෝකෝත්තර ඵල චිත්තයෝ ජවනයන් වුවද විපාක බැවින් ආසේවන ප්‍රත්‍යය නොවෙති.* එතකොට මේ විපාක ධර්මයන්ගේ ආසේවන ශක්තියක් නැහැ. *විපාක චිත්තයන්ගේ බලවත්බව හෝ දුබල බව කර්මානුරූපව සිදුවන්නකි.* විපාක සිතේ බලවත්බව හෝ දුබලබව වෙන්නේ කර්මයට අනුව මිසක් ආසේවන ප්‍රත්‍ය ශක්තියට අනුව නෙවෙයි. ඒ නිසා මේ චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ ආදී කියන ඒවාත් විපාක සිත්. ඒ විපාක සිත්වල ආසේවන ශක්තියක් නැහැ කියලා අපට මේ ධර්මයේ සඳහන්වෙන්නේ. ජවන් සිත්වල තමයි වෙන්නේ කිව්වා. නමුත් ජවනය වුනත්, ඒ ජවනයෝ විපාක නම් එතැන ආසේවන ප්‍රත්‍ය ශක්තියක් එන්නේ නැහැ. *එබැවින් ඔවුහු තමාගේ ස්වභාවය අපර චිත්තයට ගන්වන්නාහු ද පූර්

චිත්තයේ ස්වභාවය ගන්නාහු ද නො වෙති. එතකොට අර විපාක බැවින්. එබැවින් එකිනෙකට අනතුරුව උපදනා භවාඞග චිත්තයේ ආසේවන ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න භාවයට නො පැමිණෙති.

ආන්න එතකොට භවාඞ්ග හිතෙත් මේක තියෙනවා. භවාඞ්ග හිත කියන්නේ අපි නිදාගෙන ඉන්නකොට, නින්දේ ඉන්නකොට අපට වෙන හිත් නැතිවෙනකොට මේ ප්‍රතිසන්ධියෙන් ගන්න අරමුණ අරගෙන උපදින හිතක් තියෙනවා. අපි ඒකට භවාඞ්ග හිත කියලා කියනවා. දන්නවා ඇති. භවාඞ්ග හිත නැවැත ඇහැරෙන තාක් කල් ඒ හිත තමයි උපදින්නේ. බොහෝ කාලයක් උපදිනවා, නැවැත නැවැත. අපි හිතමු පැය හයක් නිදාගත්තා නම් ඔය පැය හය තුළ අරමුණ අරගෙන ම උපදී. හැබැයි කොච්චර ඉපදුණත් ඒකේ ඒ හිත බලවත් වෙන්න නැවැත නැවැත ඉපදීම කියන එක උපකාරවෙන්නේ නැහැ. ඇයි? ඒ හිත විපාක හිතක් නිසා. ඒක බලවත්බව, දුබල බව හේතුවුණේ, පෙර කරපු කර්මයේ ශක්තිය අනුව නිසා මිස නැවැත නැවැත ඉපදීම නිසා නෙවෙයි. ඒ නිසා භවාඞ්ග චිත්තයට ආසේවන ප්‍රත්‍යය වෙන්නේ නැහැ.

එහෙම වුනා එහෙම නම් හරි ප්‍රශ්නයක් වෙන්නේ, නේද. දැන් අපි නිදාගෙන ඉඳලා නැගිටිනකොට භවාඞ්ග සිත බලවත්වෙලා නම් නිදාගත්තු මනුස්සයා නෙවෙයි ඇහැ ඇරෙන කොට ඉන්නේ. වෙන කෙනෙක් ඉන්න වෙන්නේ. මොන තරම් ඒ ප්‍රායෝගික භාවද මේවා ඔප්පුවෙනවා අපට ප්‍රායෝගිකව. එහෙම ප්‍රත්‍ය ශක්තීන් ඇතැම්වල ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඇතැම් දේවල්වල ක්‍රියාත්මක වෙනවා. ඇහැ අරුනාට පස්සේ හැබැයි අපට අර වගේ කුසල් අකුසල් වශයෙන් දේවල් නැවත නැවත සිහි කරොත් ඒවා අපි හොයාගෙන යන්න, ඒවා ඇතුලේ කෙලෙස් ඇතිකරගන්න හේතුවෙනවා. *(සමහර වීථිවලදී ආවජ්ජන චිත්තය ව්‍යවස්ථාපන කෘත්‍යයෙන් කීප වාරයක් උපදී. එහෙත් එය*

දුබලවූ අජවන චිත්තයක් වන බැවින් ආසේවන ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න භාවයට නො පැමිණේ.)

එතකොට ඊළඟ "කුශල, අකුශල, විපාක, ක්‍රියා යන සතර ජාතියට අයත් චිත්තයන්ගෙන් විපාක චිත්තයේ ආසේවන ප්‍රත්‍යය නො වෙති. ඉතිරි ජාති තුනට අයත් චිත්තයන්ගෙන් ද එක් ජාතියක සිතක් අන් ජාතියක සිතකට ආසේවන ප්‍රත්‍යය නො වේ. අන්න ඒකත් වැදගත්. දැන් අපි කියමුකො අකුසල් සිත ම ගත්තහම, අකුසල් සිතේ ලෝභමූල සිතක් ඉපදුණා. ලෝභමූල සිත, ද්වේෂමූල සිතකට ආසේවන ප්‍රත්‍යය වෙන්නේ නැහැ. ඒ ජාතියේ ම එකකට තමයි ආසේවන ප්‍රත්‍යය වෙන්නේ. ඒ වාගේ ම එකක් නැවැත නැවැත සිහිකරොත් තමයි ඒක කමීයක් බවට පත්වෙන්නේ. ඒක ප්‍රතිසන්ධි විපාක දෙනවා. ද්වේෂයක් ඇතිවෙලා, ඊගාවට ලෝභයක් ඇතිවෙනකොට, දැන් දෙක ම අකුසල්වුණා කියලා එතැන ආසේවන ප්‍රත්‍යය ක්‍රියාත්මකවෙන්නේ නැහැ. *එක ම ජාතියේ සිත්වලින් ද එක් වේදනාවකින් යුක්ත සිත ඒ වේදනාවෙන් යුක්ත සිතකට ම මිස අන් වේදනාවකින් යුක්ත සිතකට ආසේවන ප්‍රත්‍යය නො වේ.*

අන්න ඒකත් වැදගත්. අපි කියමු අකුසල් සිතක්, අපි ඉස්සෙල්ලා ම කතාකළේ ලෝභමූල සිත ගැන නේ. දැන් ලෝභමූල සිතේ සෝමනස්ස සහගත දිට්ඨිගතසම්පයුත්ත ලෝභමූල සිතක් උපදිනවා. ඒක සෝමනස්ස සහගතයි කියන්නේ ඒ සිතේ වේදනාව සෝමනස්ස වේදනාවක්. ඒ වාගේ ම අකුසල් ලෝභමූල සිතක් උපදිනවා, උපෙක්ෂා සහගතව. ලෝභමූල සිත. දැන් මේ සිතේ එක සිතක වේදනාව සෝමනස්ස, අනික් සිතේ වේදනාව උපේක්ෂා. දැන් මෙ බඳු එක ම සිතක්වුනාට, එක ම ලෝභ සිතක්වුනාට, වේදනාව එකක සෝමනස්ස යි. එකක උපේක්ෂා යි. ඒ නිසා මේ දෙකේ ආසේවන ප්‍රත්‍යය වෙන්නේ නැහැ. ඒ නිසා ආසේවන ප්‍රත්‍යය වෙන්න නම් එක ම වේදනාවකින් යුක්ත සිත් නැවැත නැවැත හටගත්තහම තමයි. සෝමනස්ස සිතක්

නම්, ඒ සෝමනස්සවූ සිතක් ම නැවත නැවැත ලෝභමූල වශයෙන් උපදිනවා. අන්න එතකොට ආසේවන ප්‍රත්‍යය ශක්තියක් ඇතිවෙනවා.

එතකොට එහෙම විරුද්ධ වූ වේදනාවන් අරභයා, ආසේවන ප්‍රත්‍යය වෙන්නේ නැහැ. ඊට පස්සේ *කාමාවචර ය, රූපාවචර ය, අරූපාවචර ය, ලෝකොත්තර ය යන භූමිභේදය ආසේවන ප්‍රත්‍යය නො ලැබීමට කරුණක් නො වේ.* එහෙම වුණා කියලා භූමි භේදයකට බලපාන්නේ නැහැ. කෙනෙකුට රූපාවචර සිතක් උපදවාගෙන කාමාවචර සිතක් උපකාරවෙනවා. භූමි වශයෙන් දෙකක්. නමුත් මේක බලපාන්නේ නැහැ. දැන් ඔය උදාහරණයක් වශයෙන් අපි කියමුකෝ අපි කෙනෙක් කෙස් කියන රූප කොටස අරගෙන ඒ රූප කොටස නැවැත නැවැත මෙණෙහි කරලා රූපාවචර පඨමධ්‍යානය උපදවාගන්නවා. කේස කියන රූප ධර්මය කාමාවචර ධර්මයක්. ඒක නිසා ඉපදිච්චි රූපාවචර ධ්‍යානය රූපාවචර ධර්මයක්. නමුත් මේ කාමාවචර ධර්මය නැවැත නැවැත, නැවැත නැවැත ආසේවනය කිරීම නිසා රූපාවචර ධර්මයක් ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙලා හටගත්තා. ඒ නිසා ආසේවන ප්‍රත්‍යයට භූමි භේදය අදාලවෙන්නේ නැහැ. රූපාවචර සිතක් අරූපයට ප්‍රත්‍යවෙනවා. අරූපාවචර සිතක් ලෝකොත්තර සිතකට ද ප්‍රත්‍යවෙන්න පුළුවන්. ලෝකෝත්තර සිතකට කාමාවචර සිතක් ද, ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වෙන්න පුළුවන්. ආසේවන ප්‍රත්‍ය ශක්තිය සහජාතව ම ලැබෙන්නේ නැහැ.

අන්න ඒකයි මෙතැන තේරුම්ගන්න ඕනේ. ඒ නිසා නේ දැන් මේ ලෝකෝත්තර සිතක් කාමාවචර සිතකට ආසේවන ප්‍රත්‍යවුනා කියලා ලෝකෝත්තර සිතක කාමාවචර ධර්මයෝ තියෙනවා ද? නෑ. එහෙම ලෝකෝත්තර සිත ඇතුළේ කාමාවචර ධර්මයෝ නැහැ. ඒ නිසා, මතකතියාගන්න ප්‍රත්‍ය හා ප්‍රත්‍යඋප්පන්න ධර්මයෝ හැම වෙලාවේ ම සහජාත නැහැ. එකට නෙවෙයි උපදින්නේ. සෑම වේලාවේ ම ප්‍රත්‍යවෙච්චි

ධර්මයෝ ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙච්චි දේ අතීත දෙයක්. හටගත්තු ප්‍රත්‍යුත්පන්න දේ වර්තමාන දෙයක්. ඒ නිසා ඒ දෙක විරුද්ධ සිත් දෙකක්. එතකොට විරුද්ධ සිත් කියලා කිව්වේ ඒකේ විරුද්ධභාවය අපි තේරුම්ගන්න ඕන. එතැන මේ එක හිතක් ඇතුළේ නෙවෙයි මේ ආසේවන ශක්තිය ක්‍රියාත්මක වෙන්නේ කියන කාරණාවයි ඔබට මේ පැහැදිළි කළේ.

ආරම්මණ භේදය ද ආසේවන ප්‍රත්‍යය නො ලැබීමට කරුණක් නො වේ. ආරම්මණ භේදය - දැන් අපි කියමු ලෝභමූල සිතක් උපදිනවා රූපයක් අරමුණුවෙලා. ඊට පස්සේ නැවැත ඒ වාගේ ම ලෝභමූල සිතක් උපදිනවා ශබ්දයක් අරමුණුවෙලා. එහෙම නැතිනම් ඒ රූපයේ ම හැඩය අරමුණුවෙලා. ඒ රූපයේ ම සටහණ අරමුණුවෙනවා. හැබැයි අරමුණු වෙනස්. නමුත් ඉපදුණේ එකම ලෝභමූල සිත නම්, ආසේවන ප්‍රත්‍යය එතැන සිද්ධයි. ඒ නිසා ආරම්මණ භේදය ආසේවන ප්‍රත්‍යයට බලපාන්නේ නැහැ. ඒ නිසායි අර කියන්නේ, දැන් අපි කියමුකො දුර්වල වෙන්නත් මේවා හේතුවෙනවා නේ.

අපි කුසලයක් කරගෙන යනකොට ඒ කුසලයට, දානයක් දීගෙන යනකොට දානය තුළට කෙනෙක් කරන වැරැද්දක් නිසා මේ දාන චේතනාව දුර්වලවෙනවා. ඒ නිසා නැවැත නැවැත අර පුද්ගලයා සිහිවෙලා මේ දාන චේතනාවට තරහක් ආවොත් අර වෙනම ප්‍රත්‍යය මේ අකුසලය කැමැති ශක්තියක් කුසලයට ඇතුළුවෙනවා. ඇතුල්වෙනවා කියන්නේ, මතක තියාගන්න, අර කුසලය දුර්වල කරන්න හේතුවෙනවා. ඒ නිසා තමයි අපි අර කියන්නේ අපි පින් කරනකොට, කුසල් කරන කොට මේ අකුසල් ඇති නො කරගන්න වගබලාගන්න ඕන. හොඳයි ඒක නිකම් අපි වෙනම කාරණාවක්.

කාමාවචර චිත්තය රූපාවචර, අරූපාවචර, ලොකෝත්තර චිත්තයන්ට ද සමහර තැනක ආසේවන ප්‍රත්‍යය වේ. සංස්කාරයන් අරමුණු කරන අනුලෝම චිත්තය නිර්‍වාණය අරමුණු කරන ගෝත්‍රභූ චිත්තයට ආසේවන ප්‍රත්‍යය වේ. අන්න එතකොට ඒ අරමුණු වශයෙන් දෙකක්. ගෝත්‍රභූ සිත, එහෙම නැතිනම් අපි පරිකම් කරන විදර්ශනා සිත්, කාමාවචර සිත් ය. ඒ කාමාවචර සිතට අරමුණු වෙළා තියෙන්නේ සංඛාර ධර්‍මයන්, ලෞකීක ධර්‍මයන්. හැබැයි ඊට අනුතුරුව උපදින, නිර්‍වානය අරමුණු කරන ලෝකෝත්තර සිත, ගෝත්‍රභූ සිතක් හෝ මාර්‍ග සිතකට ආරම්මණ භේදයක් නැහැ. ඒ නිසා මේ ආසේවන ප්‍රත්‍යයේ භේදයක් නැහැ. එතකොට ගෝත්‍රභූ චිත්තයේ අරම්බණය නිර්‍වානය යි. අනුලෝම චිත්තයේ ආරම්බණය සංඛාරයක්. එහෙම නැතිනම් මාර්‍ග සිතේ අරමුණ නිර්‍වානය යි. මාර්‍ගය උපදවාගන්න හේතුවෙච්චි, අපි විදර්‍ශනා සිතක් තියෙනවා නම් ඒ සිතේ අරමුණ කාමාවචර සිතක්. නමුත් මේ ආසේවන ප්‍රත්‍යය කියන එක හේතුවෙලා තමයි ලෝකෝත්තර සිතක් ඉපදුණේ. ඒ නිසා අරමුණ ප්‍රශ්නයක් නෙවෙයි සිතක් බලවත් වෙන්න. භූමිය ප්‍රශ්නයක් නෙවෙයි හිත බලවත් වෙන්න. හැබැයි ඒ සිත්වල විරුඬත්වය බලපානවා කුසල් අකුසල් වශයෙන් වේදනා භේදයෙන් බලපානවා. විපාක අවිපාකබව බලපානවා.

ත්‍රිරාශියෙහි අනියමින් කියැවෙන ආසේවන ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මයන්ගේ ක්‍රමය මෙසේ ය. කාමාවචර කුශල චිත්තය තමාට අනතුරුව උපදනාවූ වේදනා වශයෙන් අභින්න වූ කාමාවචර කුසලයට ආසේවන ප්‍රත්‍යය වේ. එහි ඥානසම්ප්‍රයුක්ත චිත්තයෝ වේදනා වශයෙන් තමන් හා සමාන වූ රූපාවචර අරූපාවචර ලෝකෝත්තර කුශල චිත්තයන්ට ද ප්‍රත්‍යය වෙති. රූපාවචර කුශලයෝ තමන් හා සමාන රූපාවචර කුශලයන්ට ද ආසේවන ප්‍රත්‍යය වෙති. අරූපාවචර කුශලයෝ (පට්ඨාන මහා පකරණ සන්නය 55 පිටුව) තමන් හා සමාන අරූපාවචර කුශලයන්ට ද ආසේවන ප්‍රත්‍යය වෙයි. ලෝකෝත්තර කුශල චිත්තයකට අනතුරුව

ලෝකෝත්තර කුශල චිත්තයක් නූපදනා බැවින් ඔවුහු කිසිවකට ආසේවන ප්‍රත්‍යය නො වෙති. දැන් ලෝකෝත්තර සිතයි විපාක සිතයි ගත්තහම හැම වෙලාවේ ම අපි කියමුකෝ ජවන් සිත් ගත්තහම මුල් සිතට ආසේවන ප්‍රත්‍යය නැහැ. දෙවැනි සිතට තමයි ආසේවන ප්‍රත්‍යය ලැබෙන්නේ. මොකද, ආසේවනය වෙන්න නම් තමාගේ වගීයේ ම එකක් තියෙන්න එපායැ. දැන් ලෝකෝත්තර සිතේ ආසේවන ශක්තිය නැත්තේ, එක සන්තානයක එක ම වගීයේ ලෝකොත්තර සිතක් දෙපාරක් උපදින්නේ නැහැ, මාගී සිතක්. දැන් සෝවාන් මාගී සිත එකවරයි උපදින්නේ. ඵල සිත් බොහෝ උපදින්න පුළුවන්. මාගී සිත් දෙකක්, සෝවාන් මාගී සිත් දෙකක් එකවර උපදිනවා නම් එතැන ආසේවන ප්‍රත්‍යයක් තියෙනවා. නමුත් පට්ඨාන ප්‍රකරණයේ ඒ විදියට ප්‍රත්‍යය පෙන්නන කොට ආසේවන ප්‍රත්‍යය ලෝකෝත්තර චිත්තයේ නැහැ. ඒ හේතුව තමයි, ලෝකෝත්තර සිත් එක යි උපදින්නේ එකවර. ඒ නිසා එතැන අසේවනප්‍රත්‍යය නැහැ. *අකුසල චිත්තයෝ වේදනාදී වශයෙන් තමන් හා සමාන වූ අකුශල චිත්තයන්ට ම ආසේවන ප්‍රත්‍යය වෙති.* වේදනා හා සමානව. විරුඬ දෙවල්වල ඒ ශක්තිය නැහැ. *කාමාවචර ක්‍රියා චිත්තයෝ වේදනාදි වශයෙන් තමන් හා සමාන වූ කාමාවචර ක්‍රියා චිත්තයන්ට ප්‍රත්‍යය වෙති. (එහි ඥානසම්ප්‍රයුක්ත චිත්තයෝ වේදනා වශයෙන් තමන් හා සමාන වූ රූපාවචර අරූපාවචර ක්‍රියා චිත්තයන්ට ද ආසේවන ප්‍රත්‍යය වෙති. රූපාවචර ක්‍රියා චිත්තයෝ තමන් හා සමාන වූ රූපාවචර ක්‍රියා චිත්තයන්ට ආසේවන ප්‍රත්‍යය වෙති. අරූපාවචර ක්‍රියා චිත්තයෝ තමන් හා සමාන අරූපාවතර ක්‍රියා චිත්තයනට ප්‍රත්‍යය වෙති. කුශලාදීන් අතුරෙන් ආසේවන ප්‍රත්‍යය ලැබූ චිත්තයෝ නො ලැබූ චිත්තයනට වඩා බලවත් වෙති.)*

ඒ විදියට රූපාවචර අරූපාවචර සිත්වල මේ ආසේවන ප්‍රත්‍යය තියෙනවා. ඊට පස්සේ ඒ විග්‍රහ වාක්‍ය ගත්තහම, මේ අපි කියමු පදගතාර්ථය ගත්තහම එතැන පෙන්නන්නේ ***ආ පුනපපුනං සෙවතී ති ආසෙවනං*** *(කතෘ සාධක විග්‍රහය යි.)*

කියලා තමයි ඒ වචනය හැදිලා තියෙන්නේ. එහෙම නැති නම් ***ආ පුනපපුනං සෙවිතබබනති ආසෙවනං*** *(කම් සාධක විග්‍රහය යි.)* අතන කතෘ සාධක විග්‍රහය යි. මෙතැන කම් සාධක විග්‍රහය යි. කතෘ සාධක විග්‍රහයේ පෙන්නන්නේ *ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් නැවැත නැවැත සේවනය කරන්නේ ආසේවන නම්.* ප්‍රත්‍යයෙන් හටගත්ත ධර්මයන් නැවැත නැවැත සේවනය කරනවා කියන්නේ අපි සිහිකර කර ඉන්නවා. ඒකයි ආසේවන ශක්තිය කියලා කියන්නේ.

ඒ විදියට ආසේවන ප්‍රත්‍යය, ප්‍රත්‍යවෙලා මේ අකුසල් උපදින්න පුළුවන්. එතකොට අවිද්‍යාව තමයි මේ ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවුණේ. ඒ ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙලා ඊට පස්සේ අපුඤ්ඤාභිසංඛාර ඇතිවෙනවා. ඊට පස්සේ තව හේතුප්‍රත්‍ය, ආරම්මණ ප්‍රත්‍යය, සහජාත ප්‍රත්‍යය වගේ මේ දේවල් නිසා අකුසල් සිත් ඇතිවෙන්න පුළුවන්. එතකොට ඒ අකුසල් සිත් අවිද්‍යාව නිසා ඇතිවෙන්නේ කොහොම ද කියන එක කාරණාව අපි තේරුම්ගන්න ඕන. අවිද්‍යාවෙන් මුලාවෙලා ඉන්න කෙනා, ඒ මුලාව නිසා බොහෝ අකුසල් රැස්කරගන්නවා. ඒ වාගේ ම එයා ප්‍රතිසන්ධියේ දී මුළාවෙනවා. උත්පත්තියේදී මුළාවෙනවා. පැවැත්මේ මුළාවෙනවා. පටිච්චසමුප්පාද ධර්මයන්ගේ මුළාවෙනවා. අතීත අනාගත ධර්මයන්ගේ මුළාවෙනවා. ඒ නිසා එයා බොහෝ අකුසල් සිද්ධකරගන්නවා.

දැන් අපි කියමු, ප්‍රතිසන්ධියක් ගත්තහම පෙර කර්මය නිසා මේ ජීවිතයේ දී ප්‍රතිසන්ධි විපාක සිතක් උපදිනවා. කර්මය කියන එකත් අනාත්ම ධර්මයක්; විපාක කියන එකත් අනාත්ම ධර්මයක්. නමුත් ඒ මේ ප්‍රතිසන්ධි ක්‍රියාවලිය නො දන්නා කෙනා පුද්ගලයෙක් ඉපදෙනවා කියලා එයා දන්නවා. සත්වයෙක් භවයෙන් භවය උපදිනවා කියලා ප්‍රතිසන්ධිය වරදවාගන්නවා. චුතියේ දී මුළාවෙනවා කියලා කියන්නේ, මේ පැවැති ස්කන්ධ ටික නිරුද්ධ වෙනවා. නිරුද්ධභාවයට පත්වෙනවා. නමුත් ඒ ස්කන්ධ ටික පුද්ගලභාවයෙන් අරගෙන

ඒ නිරෝධය, කෙනෙක් මැරුණා - පුද්ගලයෙක් මැරුණා කියලා මුළාවෙනවා. චුතියේ දී ත් මුළාවෙනවා. ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ගෙ ත් මුළාවෙනවා. දැන් අපට අකුසල් සිතක් උපදින කොට අපි දන්නේ නැහැ, මේ අවිද්‍යාව නිසා යි මේ සංඛාරය හටගත්තේ කියලා. ඔහු හිතන්නේ, මට මෙහෙම කල්පනාවක් ඇතිවුණා. මෙහෙම දෙයක් නිසා තමයි මට මෙහෙම සිත් ඉපදුණේ කියලා ඒ විදියට මේ විදියේ අවිද්‍යාව නිසා මේ පටිච්චසමුප්පාද ධර්මයන්ගේ ද මුළාවට පත්වෙනවා. මේකේ තවත් අපට විග්‍රහකරගතයුතු බොහෝ තැන් තියෙනවා. මම මේ වෙලාවේ ඒක කතාකරන්න යන්නේ නැහැ.

ඊළඟ දේශනාවේ දී යම් වැදගත් දෙයක් තිබුනොත් මම ඒක මෙතැනට අදාල කරළා කතාකරනවා. නැතිනම් අපට ඊළඟ කතාකරන්න තියෙන්නේ ***සංඛාර පච්චයා විඤ්ඤාණං*** කියන කාරණාව යි. සංඛාරය නිසා විපාක විඤ්ඤාණය ඇතිවෙන්නේ කොහොම ද කියන කාරණාව තමයි, ඊළඟට අපට කතාකරන්න තියෙන්නේ.

ඒ නිසා අද ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන කාරණාව කතාකරා. ඊට පස්සේ තව එකක් තියෙනවා, ආණෙඤ්ජාභිසංඛාර කියන කාරණාව. එතකොට ආණෙඤ්ජාභිසංඛාර කියලා කියන්නේ, අපි කතාකරා, මොනවාද, අරූපාවචර කුසල චේතනා ආණෙඤ්ජාභිසංඛාර යි. ආණෙඤ්ජාභි ධර්මයෝ හම්බවෙනවා කුසල විපාක ක්‍රියා කියලා අපට ධර්මතා පහළොවක් ම හම්බවෙනවා. දොළහක් අරූපාවචර ධර්ම ටික යි. නමුත්, අවිද්‍යා ප්‍රත්‍යයෙන් උපදින සංඛාර කියනකොට ගන්නේ විපාක ක්‍රියා නෙවයි, අවිද්‍යාව නිසා ඉපදිච්චි කර්ම බවට පත්වෙච්චා. එතකොට අපට ආණෙඤ්ජාභිසංඛාර හැටියට ගන්න තියෙන්නේ අරූපාවචර කුසල චේතනා හතර පමණ යි. ඒක ප්‍රත්‍යවෙන්නේ අවිද්‍යාව, උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් තමයි ප්‍රත්‍යවෙන්නේ. ඒ නිසා කෙනෙක් අරූපාවචර ධ්‍යානයක් උපදවා ගන්නේ ම, එයා කල්පනා

කරනවා මේ රූපය නිසා බොහෝ දුක් උපදින්නට පුළුවන්. ඒ විතරක් නෙවෙයි, මේ කාම ධර්මයෝ නිසා, මේ රූප-ශබ්ද-ගන්ධ ආදී පඤ්චකාමයන් නිසා සංසාරයේ බොහෝ දුක් විඳිමින්, දුක් ගැහැට, ලෙඩවීම්, මහළුවීම්, ජරාවට පත්වීම් ආදී මහා දුක් ගොඩක්.

ඒ වාගේ ම තිරිසන් අපාය, ප්‍රේත ලෝකය, මේවායේ උපදින්නේ මේ කාමයට ඇලුම්කරපු නිසා යි නේ ද, කියලා, මේ මෝඩකම, කාමරූප ධර්මයන්ගේ තියෙන නිසා මේ දුක් විඳින්න වෙනවා කියලා දැකලා එයා අරූපය තුළ රූපය නැති නිසා මේ කිසි ම දුකක් නෑ නේ ද කියලා එයා කල්පනා කරනවා. කල්පනා කරළා රූපයට තියෙන මුලාව, රූපයට තියෙන ආශාව යටපත්කරගන්නවා ධ්‍යාන බලයෙන්. දැන් ඒ මුලාව ප්‍රත්‍යය වුණා ආණෙඤ්ජාභිසංඛාරයක් උපදවාගන්න. ඒ නිසා ඔහු ඒ අරූපාවචර ධ්‍යානයක් උපදවාගන්න බලවත් සිතක් තිබුණා. කොහොමහරි මේ කාමවලට තියෙන ආශාව අයින්කරගන්න ඕන. කාමයයි කියන එක වැරැදි දෙයක්, නිස්සාර දෙයක් කියලා අන්න ඒ අවිද්‍යාව බලවත් ලෙස උපකාර කළා. ඒ නිසා කියනවා ආණෙඤ්ජාභි සංඛාරයට අවිද්‍යාව උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙනවා කියලා.

මේක තව ගොඩාක් විස්තර කරන්න ඕන කාරණාවක්. නමුත් අද සාකච්ඡාවට කාලය මදි. ඒ නිසා ඒ විදියට පුන්‍ය, අපුන්‍ය, ආනෙඤ්ජාභි කියන සංඛාරයන් අවිද්‍යාව නිසා ඇතිවෙනවා කියලා අපි දතයුතු යි. තව මේක ඔබ සාකච්ඡාවට හෝ ගන්න පුළුවන් මේකේ නො තේරිච්චි කාරණා ඔබට ගන්න පුළුවන්. මුලින් කතාකරපු දේවල් තුළ හෝ. ඒ නිසා මේක මම දැන් අවසන් කරනවා, සාකච්ඡාවට ඉඩ තබලා.

හැම දෙනාට ම තෙරුවන් සරණ යි.

ප්‍රශ්නයක් :- (අපැහැදිලි යි.) තෙරුවන් සරණ යි. මනුස්සයන්ට, මනුස්ස වර්ගයාට සමාන ගති පැවැතුම් තියෙනවා ද? කෙනෙකුට ලස්සනයි කියලා හිතුනොත් බොහෝ දෙනෙකුට ඒක ලස්සන වශයෙන් දකින්න පුළුවන්. ඒ කියන්නේ මලක් වගේ දෙයක් බොහෝ මනුස්සයින්ට ලස්සණ යි. නමුත් බල්ලෙකුට එහෙම නො වෙන්න පුළුවන්. බොහෝ දෙනෙකුට අකැමැති දේවල්. ඒ තත්ත්වය ඇතිවෙන්නේ කොහොම ද ස්වාමීන් වහන්ස?

පිළිතුර:- ඒක ඇතිවෙන්නේ මේ අරමුණ මත තියෙනවා, අපි අරමුණ බෙදනවා ඒක ඔය ආරම්භණය කියන කාරණාව කතාකරොත් ඉෂ්ඨාරම්භන අනිෂ්ඨාරම්භන කියලා කාරණාවක් ගැන කතා කරනවා. එතකොට මේ ඉෂ්ඨාරම්භණය විපාක ගැන කතාකරණකොට පෙනෙන්න ඉෂ්ඨ විපාක. අනිෂ්ඨ විපාක. දැන් අපට චක්ඛු විඤ්ඤාණයක් උපදින කොට ඒ චක්ඛු විඤ්ඤාණ සිතට අරමුණු වුනේ හොඳ, යහපත් රූපයක් නම් ඒකට කියනවා ඉෂ්ඨ විපාකයක් කියලා. බුදුරුවක් දැකීම කුසල විපාකයක්. බුදුරුව කියන එක ඉෂ්ඨ රූපාලම්බණයක්. ඒක නිසා ඒක බොහෝ, හැමෝට ම ඒක හොඳ සිත් උපදින්න පුළුවන්කම තියෙන එකක්. එතකොට මේ ඉෂ්ඨ අණිෂ්ඨබව අප තුළ ඇතිවෙච්චි, හිතෙන් බෙදන එකක් නෙවෙයි. ඒ ඉෂ්ඨ අනිෂ්ඨබව ආරම්මණයෙන් බෙදෙන එකක්. ඒ නිසා එහෙම රූපාරම්මණ කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළා ***ඉටඨා කාන්තා මනාපා පියරූපා රජණීයා කාමූපසංහිතා රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා*** කියලා. එතකොට ඒ විදියට ඒ ඇතැම් රූප තියෙනවා ඉෂ්ඨ කාන්ත. ඒ නිසා බොහෝ දෙනාට ඒ අරමුණේදිත් ඒ විදියට ලෝභ සහගත සිත් උපදින්න පුළුවන්. බුදුරුව දැකීමෙන් බොහෝ දෙනාට හොඳ කුසල් සිත් උපදින්න පුළුවන්කම තිබුණේ ඒ අරමුණ තුළ එහෙම ශක්තියක් තිබුණ නිසා යි. ඒකට කියනවා ආරම්මණාධිපතිශක්තිය කියලා. ඒක ඒ රූප ධර්මය තුළ තිබුණු එකක්. ඒ නිසා අපට කුසල් අකුසල් ඇතිවෙන්න පුළුවන්. අපි

කියමුකො, අනිෂ්ඨ අරමුණක් කියන එක, මළකුණක් කියන එක, ස්වභාවයෙන් ම අනිෂ්ඨ යි. මනුස්සයාට මේකේ පිළිකුළක් ඇතිවෙනවා. බල්ලාට, ඌරාට මේකේ ලෝභ මූල සෝමනස්ස සහගත සිතක් උපදිනවා. හැබැයි මේක ඌරාට සෝමනස්සයක් ඉපදුණත්, මනුස්සයාට දෝමනස්ස සහගත සිතක් ඉපදුණත්, අරමුණ අනිෂ්ඨ අරමුණක් ම යි. ඒ නිසා ඒ විදියට අරමුණ මත තියෙන ඒ ශක්තිය මත පදනම්වෙලා තමයි අපට ඒ විදියේ විවිධාකාරයේ සිත්, සමාන සිත් උපදින්න පුළුවන්කම තියෙන්නේ. තෙරුවන් සරණ යි.

ප්‍රශ්නයක් :- (අපැහැදිළියි.) විශේෂයෙන් ආසේවන ප්‍රත්‍යය පිළිබඳව ඔබවහන්සේ හයිලයිට් කළේ අපුඤ්ඤාභිසංඛාර වුණාට ඔබවහන්සේ කියපු අනික් ඒවායින් පොඩ්ඩක් පෙනෙනවා දැන් ඒක පටිච්චසමුප්පාදය නිරවශේෂව ප්‍රත්‍යවනවා නේද කියලා. පොඩ්ඩක් ඔබ වහන්සේ පෙන්නනකොට පෙන්නුවා නේ අර සංඛාර අරමුණුකරලා අනුලෝම චිත්තය නිර්මාණය අරමුණුකෙරෙන ගෝත්‍රභූ චිත්තයට ආසේවන වශයෙන් ප්‍රත්‍යවෙනවා කියලා. මට හිතෙනවා දැන් ඔය ධ්‍යාන වඩනකොට විතර්ක විචාර කරන්නේ ආසේවනය කරගන්න යි. ඒ වාගේ ම ඒක තමයි මගේ ප්‍රශ්නය. බුදුහාමුදුරුවෝ දැන් අපට කියනවා නේ භාවිතා බහුලීකතා කරන්න කියලා. මගේ ප්‍රශ්නය තමයි දැන් ප්‍රඥාව ඔබවහන්සේ විශේෂයෙන් අහුවුනේ අවිද්‍යාවෙන් ප්‍රත්‍යවෙන හැටි නේ. මට හිතෙනවා මේක මේ ප්‍රඥාවෙනුත් ප්‍රත්‍ය කරගන්න පුළුවන් එකක් ද කියලා මේ ආසේවන ප්‍රත්‍යය.

පිළිතුර:- හා හරි හරි. කිසිම ගැටළුවක් නැහැ ඒ බොහොම හොඳ ප්‍රශ්නයක්. මම උපමාවක් ගත්තේ අකුසලය. මොකද, මම ඒ අකුසලය ගන්න හේතුවෙන්නේ ඇත්තට ම අපට දුරුකළ යුත්තේ අකුසලය නිසා යි. මේක අපගේ ජීවිතයට

වැදගත්වෙන්නේ ඒක නිසා යි ඒ සිත ගත්තේ. නමුත් ආසේවන ශක්තිය සෑම සිතක ම යෙදෙන්න පුළුවන්. ඒ කියන්නේ ආසේවන ප්‍රත්‍යය කියන එක ප්‍රත්‍ය උපකාර වෙන්න පුළුවන්. කතුසල් සිතෙත්, දැන් අර ඒ මහත්මිය කිව්වා වාගේ බොහෝ පෙන්නනවා. දැන් භාවිතා බහුලීකතා යානිකතා වස්තු කතා අනුචිතා පරිචිතා කියලා මේ කුසලය යි පෙන්නන්නේ. ආසෙවන ශක්තිය තමයි ඒක. සූත්‍ර ක්‍රමවල ආසේවන ප්‍රත්‍යය ඔන්න ඔය විදියට තමයි කියලා තියෙන්නේ. එතකොට ඒක ආසේවනය කියන වචනය කිව්වේ නැතුව භාවිතා බහුලීකතා කියලා කිව්වහම අර මුලින් මුලින් ඉපදිච්චි කුසල් සිත් පසුව පසුව උපදින කුසල්සිත්වලට ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙනවා. අපට විග්‍රහ වාක්‍යය ගත්තොත් හම්බවෙන්නේ ***පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයො*** කියලා යි. ***පුරිමා පුරිමා අභ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අභ්‍යාකතානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයො*** කියලා ඒ පාළි විග්‍රහයේ තියෙනවා. මම ගත්තේ ***පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයො*** කියලා යි. අන්න එතකොට මම අකුසලය ගත්තාට මේ පෙලේ ඒ ගත්තහම ආසේවන ශක්තිය කුසල් තුළත් තියෙනවා. අකුසල් තුළත් තියෙනවා. ඒ වාගේ ම අර කියාපු අව්‍යාකත කියන ක්‍රියා ව්‍යාපෘතියත් තුළ තියෙනවා. හැබැයි විපාකය තුළ ආසේවන ශක්තිය නැහැ. ඒ වාගේ ම ඒක අපි තේරුම්ගන්න ඕන මේ ආසේවන ශක්තිය කුසලයෙන් අකුසලයට ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපි වරදවා තේරුම්ගන්න එපා අවිද්‍යාව ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙලා පුඤ්ඤාභිසංඛාර ඇතිවෙනවා කියලා ගත්තොත් වැරැදි යි. ඒක වෙනම කතාවක්. එහෙමවුණොත් අපට දැන් අකුසලය නැවැත නැවැත ඇතිවෙලා කුසල් ඇතිවෙනවා කියන එක වෙනම කාරණාවක්. එතකොට කුසල් සිත් නැවැත නැවැත ඉපදීමෙන් ආසේවන ශක්තිය ලැබුවේ මුලින්

මුලින් ඉපදිච්චි කුසල්සිත්වල තමයි ආසේවන ශක්තිය ලැබුවේ. එතකොට අවිද්‍යාව ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවුනා මිසක් ආසේවන ශක්තියෙන් නෙවෙයි ඒ වෙලාවේ කුසලයට ප්‍රත්‍යවුනේ. උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් හෝ ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙනවා කියන ඒ නිසා යි. ඒ නිසා මෙතැන පටලවාගන්න එපා. අපට හිතෙන්න පුළුවන්. දැන් අපි අකුසලයක් නැවැත කැවැත සිහිකර කර ඒකේ ආදීනව බලන්න බලන්න දැන් ඒ අකුසලයත් කුසලයට කියලා ආසේවනය වෙලා නැද්ද? එහෙම හැඟීමක් අපට එන්න පුළුවන්. එතැන ආසේවන ශක්තියක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එතැන වුණේ ඒ අකුසලය අරමුණුවීම විතර යි. නැවැත නැවැත අරමුණුවෙළා, හැබැයි ඒ විනාඩි පහක් නම් ඒක කරේ එයාට ඒ විනාඩි පහ තුළ ම හටගත්තේ කුසල් සිත්. ඒ කුසල් සිත් ඇතුළේ තමයි ආසේවන ශක්තිය තිබුණේ. ඒක වෙනම කාරණාවක්.

නමුත් ඒ මහත්මිය අහපු ප්‍රශ්නය අනුව ආසේවන ශක්තිය කුසලයේත් තියෙනවා. අකුසලයේත් තියෙනවා. අව්‍යාකෘතයේත් තියෙනවා. හැබැයි විපාක අව්‍යාකෘතයේ නැහැ. විපාක සිත්වල නැහැ. ක්‍රියා සිත්වල පමණයි ඒක යෙදෙන්නේ. එතකොට කුසල ආසේවන ශක්තිය ලැබෙන්නේ කුසල් කුසල්. අකුසල් ආසේවන ප්‍රත්‍යය ලැබෙන්නේ අකුසල් අකුසල්. ඒ නිසා ආසේවන ශක්ති මේ තුන්වඟීයේ ම තියෙනවා. ඒක ලැබෙන විදිය යි අපි තේරුම්ගන්න ඕන.

නැවත ප්‍රශ්නය:- (අපැහැදිළියි.) ඔබ වහන්සේ ඉස්සෙල්ලා වදාළා නේ දැන් ආසේවන ප්‍රත්‍යය වෙන්න නම් සිත් දෙකක් එක ගාව තියෙන්න ඕන කියලා. එතකොට මට හිතුනා හිතට අකුසලයක් ඇවිත් තියෙන වෙලාවක ඒක නිසා නේ අපට මේක ආසේවනය නොවෙන්න නේ අපට විදර්ශනාවක් හරි මොකක් හරි ඊළඟට වෙන සිතක් ඇතිකරගන්නේ. එතකොට එතැන ආසේවනය කඩන්නද?

පිළිතුර:- ඔව්, එහෙම තමයි. ඒ අකුසලය ඒ ආසේවනය කඩනවා දැන්. ඒ වෙනුවට කුසල ආසේවනයක් ඇතිකරගන්නවා. මොකද, අකුසලයක් ආසේවනය වුණොත් ඒක හානිදායක යි. ඒක අපට සසර යන්න හේතු වෙනවා. හැබැයි කුසලයක් ආසේවනය වුණා කියලා ඒක අපට දුක් උපද්දවන්නේ නැහැ. සසර උපදිනවා. හැබැයි ඒක සැප විපාකයි ගෙනැත් දෙන්නේ. හැබැයි ඒ කුසලය පහසුවෙන් අයින් කරගන්න පුළුවන්කමක් තියෙනවා, ලෝකෝත්තර ධර්ම උපදවාගෙන. ඒ නිසා අකුසලය ආසේවනය වෙන එක හානිකර නිසා ඒ වෙනුවට කුසල් ආසේවනය කිරීම තමයි එතැන කරන්නේ. එතකොට අර නැති දේ අකුසල් ආසේවන ශක්තිය තමයි නැත්තේ.

ප්‍රශ්නය:- ඔය ඒ ප්‍රශ්නයට ම අදාල තව ප්‍රශ්නයක්. දැන් අප තුළ චිත්තයක් පවත්වන අරමුණක් දිගින් දිගට ආසේවනය කරන එක ද, විතක්ක විචාර කියන එකෙන් අපි අදහස් කරන්නේ? ඒක ප්‍රපංච සංඛාරයක් බවට පත්කිරීමට ඒ ආසේවන බලපානවා ද?

පිළිතුර:- ඔව් ඔව්. අනිවාර්‍යයෙන් ම. ඒ විතක්ක විචාර කියන්නේ ම ආසේවන ප්‍රත්‍යයට ම යි. ධර්ම වශයෙන් ගත්තොත් එතැන, ආසේවනය තියෙන තැන විතක්කය, විචාරය. විතක්කය කියන්නේ නැවැත නැවැත ඒ අරමුණට ම හමුවනබව, ඒ වාගේ ම ඒ අරමුනෙන් නැවැත නැවැත හැසිරෙනබව කියන මේ ධර්මතා දෙකක් සිතක් ඇතුළේ ක්‍රියාත්මක වෙනවා. එතකොට ඒ තුළ මේ ආසේවන ශක්තිය තමයි එතැන ධර්මයක් වශයෙන් ගත්තොත් මිසක් විතක්කය තුළ ආසේවන ශක්තියක් තිබිලා තියෙනවා. විචාරය තුළ ආසේවන ශක්තියක් තිබිලා තියෙනවා. ඒ නිසා අපි අර මුලින් ම කතා කරේ අපි තේරුම්ගන්න ඕන. මේ ධර්ම කියන ඒවා අනෙකක්. ශක්තීන් කියන ඒවා ඒ ධර්මයන් තුළ තියෙන

දේවල්. ඒ නිසා මේ ආසේවන ප්‍රත්‍ය ශක්තීන් අපට ධර්මයන්ගෙන් තොරව කතාකරන්න බැහැ. ඒ මොකද, ඒ ශක්තීන් ඉබේ හටගන්නා දේවල් නෙවෙයි. ඒ නිසා ධර්ම ටික ඇහින්දොත් අපට හම්බවෙන්නේ එක්කෝ විතර්ක, විචාරය, අවිද්‍යාව, කුසල් පැත්තෙන් ගත්තොත් අර වාගේ වේදනාවක්, සංඥාවක් - මෙහෙම හම්බවෙනවා. ධ්‍යාන වාගේ සිත්වල ගත්තොත් එතැන මතුවෙලා පෙනෙන්න තියෙන්නේ විතක්ක විචාර වාගේ ධර්මයන්ගේ ම තමයි ආසේවන ශක්තිය. ඒ නිසා ඒක ආසේවන ශක්තියක්. ඒ ශක්තිය ඒ ධර්මයන්ගේ තුළ තියෙනවා. ඒ නිසා අපි අන්න ඒක හොඳට තේරුම්ගන්න ඕනේ. ආසේවන ප්‍රත්‍ය ශක්තිය එකක්. ඒ ධර්මයෝ අනෙකක්. මේ දේවල් එකින් එකට සම්බන්ධයි කියන කාරණාව.

ප්‍රශ්නය:- මෙතැන සූවිසි ප්‍රත්‍යයක් ගැන කතාවෙනවා. එතකොට අපට මේ අධ්‍යයණය වෙනවා ද මේ ප්‍රත්‍යයන් විසිහතරේ ම වෙනස? ඒ අතරතුර අපි කොහොම ද උදාහරණයක් හැටියට මේ විදර්ශනාවේ දී මේ ප්‍රත්‍යයන් භාවිතා කරන්නේ කියන එක ගැන පොඩි විස්තරයක් කරන්න ස්වාමීන් වහන්ස.

පිළිතුර:- ඔව් දැන් අපි ඇත්තට ම ඒක තමයි කතා කරේ. දැන් විදර්ශනාවට කොහොම ද මේ ප්‍රත්‍ය ශක්තියෙන් ඇතුළත් වෙන්නේ කියලා. අවිද්‍යාව කියන එක මොන ආකාරයට ද සංඛාරයට උපකාර කියන කාරණාව අපි දැන් කතාකරා. එතකොට ඒ විදියට දැන් අපි ගත්තහම එතැන විදර්ශනාවට ගන්නේ ම ඒ ප්‍රත්‍ය ශක්තිය හා ඒ ධර්මයන් ගවේශණය කිරීමෙන්, පරිශීලණය කිරීමෙන්ම යි අපට ඒ විදර්ශනා ඥාන උපදවාගන්නේ. ඉතින් ඒ නිසා ඒක ගැන ම තමයි අපි මුලින් කතාකරේ අර විදියට. ඒ ප්‍රත්‍යය කියන්නේ මොකක් ද? ධර්මය කියලා කියන්නේ මොකක් ද? ඒ ධර්මයන් මතුකරගන්න ඕන, වේදනා දී ධර්මයන්. ඒ ඔක්කෝම අර මම

මුලින් කතා කර විදර්ශනා ඥාන ඔක්කෝම මෙතැනට සම්බන්ධකරගන්න පුළුවන්. ඒක මම හිතන්නේ ඒකට ගලපාගන්න විතර යි තියෙන්නේ. විස්තරය එතැනට ගලපාගත්තහම මම හිතන්නේ අපේ මහත්මයාගේ ප්‍රශ්නයට උත්තරය ලැබෙයි කියලා.

නැවත ප්‍රශ්නය:- එහෙමයි ස්වාමීන් වහන්ස. එතකොට මේ ප්‍රත්‍ය විසිහතර ම අපට ඒ ඒ ප්‍රත්‍යයන්ගේ වෙනස අධ්‍යනය වෙනවා ද ස්වාමීන් වහන්ස?

පිළිතුර:- ඔව්. හැබැයි මෙහෙම යි. ඒ ප්‍රත්‍ය විසිහතර ගත්තහම ඒක හැම සිතක ම ප්‍රත්‍ය විසිහතර යෙදෙන්නේ නැහැ. ඒ ඒ සිතට අදාලව යෙදෙන ප්‍රත්‍ය ශක්තීන් තියෙනවා. ඒ වාගේ ම ඒ ප්‍රත්‍ය ධර්මයන් තියෙනවා. ඒ එකිනෙකට විරුද්ධ ප්‍රත්‍ය ශක්තීන් තියෙනවා. ඉතින් ඒවා අපි වෙන්කරගන්න ඕන. කවදාවත්, මේ ප්‍රත්‍ය විසිහතරක් තිබුණාට විසිහතර එක සිතක යෙදෙන්නේ නැහැ. ඕකම නේ අපට පටිච්චසමුප්පාදයෙන් හම්බවෙන්නේ. පටිච්ච සමුප්පාදයේ අවිජ්ජා පච්චයා සංඛාරා කියලා කිව්වහම, සංඛාර කියනවා පුඤ්ඤාභි, අපුඤ්ඤාභි, ආනෙඤ්ජාභි කියලා. කාය සංඛාර, වචී සංඛාර, චිත්ත සංඛාර. මේ ඔක්කෝම අවිද්‍යා ප්‍රත්‍යයෙන්. හැබැයි කවදාවත් එක සිතක ඕවා ටික හටගන්නවා ද? පුඤ්ඤාභි, අපුඤ්ඤාභි, ආනෙඤ්ජාභි කවදාවත් එක සිතක හටගන්නේ නැහැ. නමුත් අපට එහෙම සඳහන් වෙනවා. සුවිසි ප්‍රත්‍යයක් තියෙනවා. ප්‍රත්‍ය සූවිස්සක් තිබ්බාට මේවාගෙන් ප්‍රත්‍ය සුදුසු ආකාරයට ඒ හිතට අනුව ගලපාගන්න ඕනේ. හැබැයි එකක් මතක තියාගන්න ඕනේ. කවදාවත් සිතක් උපදින්නේ නැහැ, එක ප්‍රත්‍යයක් විතරක් ප්‍රත්‍යවෙලා. ඒ නිසා ප්‍රත්‍යධර්මයෝ බොහෝවිට කිහිපයක් ප්‍රත්‍යවෙලා තමයි යම් ඵල ධර්මයක් උපදින්නේ. එතකොට ඵලය ද එකක් නෙවෙයි. විපාකය ද එකක් නෙවෙයි. ඒ නිසා රූපය ගත්තත් තනි රූපයක් උපදින්නේ නැහැ නේ. ඒ රූපයක් ගත්තහම, රූපස්කන්ධයක්

කිව්වහම, රූප රාශියක්. එතකොට ඵල වශයෙන් රාශියක්. ඒක උපදින්න හේතු ගත්තහම හේතු ධම්ම රාශියක් තියෙන්නේ. ඒ නිසා හේතුව එකක් වෙන්නේ නැහැ. හේතු කිහිපයක් වෙන්න පුළුවන්. ඵලයත් එකක් වෙන්නේ නැහැ. නා නා ඵල වෙන්න පුළුවන්. නා නා හේතු තුළින් නා නා ඵළ මිසක් ඒක හේතුවකින් ඒකඵල උපදින්නේ නැහැ. ඒ නිසා ඒකත් තේරුම්ගන්න ඕන. හැබැයි, සියලු හේතු උප හේතු වෙන්නේ නැහැ. යම් ඵලයක් උපදිනවා.

ප්‍රශ්නයක්:- (අපැහැදිළියි.) අවසරයි ස්වාමීන් වහන්ස, ගිය සුමානේ ධම්ම සාකච්ඡාවේ දී ප්‍රකාශකරා. පුණ්‍යකම්වලින් අකුසලකම් අඩුවෙනවා කියලා. මම හිතාගෙන හිටියේ කුසල කම් වෙනම පලදෙනවා. අකුසල කම් වෙනම පලදෙනවා කියලා. මම දැනගෙන හිටියේ නැහැ පුණ්‍යකම්යක් හින්දා කුසල කම්යක විපාකයක් අඩුවෙනවා කියලා. ඒක ගැන පොඩ්ඩක් අපට කියලා දෙන්න.

පිළිතුර:- කම් විෂය කියන එක ටිකක් පුළුල් මාතෘකාවක්. ඒ නිසා ඒක තේරුම්ගන්න ඕනෙ අපි. ඇත්තට ම යම් න්‍යායකින් කිව්වොත්, අපි කියමුකෝ කෙනෙක් සතුන් මරලා දන්දෙනවා. සතුන් මැරීම කියන එක අකුසලයක්. ඒක වෙනම විපාකයක් හම්බවෙනවා. ඊට පස්සේ තව කෙනෙක් දානය දුන්න නිසා දාන විපාක තව සිධියක්. මේ දෙක දෙකක්. ඒ නිසා දාන චේතනාව ඉදිරිපත්වුනොත් එයාට ඉෂ්ඨ විපාක දෙනවා.

හැබැයි ඒක නිසා සතුන් මැරුවා කියලා කිව්වොත්, අනිෂ්ඨ විපාක ගෙනැත් දෙනවා. එතකොට එහෙම වීමක් තියෙනවා. එහෙම එකක් නැතුවා නෙවෙයි. නමුත් මේ සිද්ධාන්තය ඇතුලේ තව කම්යක් තියෙනවා. උපඝාතක, උපපීඩක, උපත්ථම්භක කියලා ධම්තාවයක් තියෙනවා. අන්න ඒ ශක්තියත් මේ කම්ය තුළ ම තියෙන එකක්. ඒ නිසා

උදාහරණයක් වශයෙන් ගත්තොත්, අපි කියමුකෝ, තිරිසන් සතෙක් වෙලා ඉපදුණාට, තිරිසන් සතා ඉපදුණේ අකුසල් සිතකින්. නමුත් ඒ සතා, පෙර කරලා තිබුනු කුසල් නිසා, ඒ සතා බල්ලෙක් නම් ඔහුට ගෙදර දී ආහාර පාන, ඉන්න තැන්, මේ සියල්ල උසස් ලෙස ලැබෙණවා. සැලැකිලි ලැබෙණවා. එතකොට මේ උපස්ථම්භකයක් ඇවිල්ලා තියෙනවා, අර අකුසලයක් වුණාට, පූවී අකුසලයක් වුණාට, පෙර කරපු කුසලයෝ අර අකුසලයෙන් බල්ලෙක් වෙලා ඉපදිලා ඒකෙන් දුක් විඳින්න තියෙන දේ වළක්වලා, තිරිසන්ගත සතෙක් වුනත්, ඒ ආත්මය තුළ සැප විපාක ගෙනැත් දෙන්න අර පෙර කරපු කුසල් උපස්ථම්භන හැකියාවක් තිබිළා තියෙනවා. ඒ උපස්ථම්භක ශක්තිය යි.

උපඝාතක ශක්තිය කියලා කියන්නේ සමහර විට කෙනෙක් මනුස්සයෙක් වෙලා ඉපදිලා, මනුස්සයා වශයෙන් ඉපදිලා අවුරුදු සීයක් ජීවත්වෙන්න ආයුෂ තිබුණා. නමුත් හිටිහැටියේ ම පෙර කරපු ප්‍රාණඝාත අකුසලයක් පඩිසන් දීලා හිටිහැටියේ ම ඔහු රිය අනතුරක් වෙලා මරණයට පත්වෙනවා. අර කුසලයට උපඝාතක කම්යක් ඇවිල්ලා අර කුසලය නසලා දැම්මා. ඒ විදියට ප්‍රත්‍යවීමක් මේ කුසලය නිසා අකුසලයටත්, අකුසලය නිසා කුසලයටත්, මේක උපස්ථම්භක, උපපීඩක, උපඝාතක කියන ශක්තියක් තියෙන්නේ. ඒ එකක්.

අනික් පැත්ත තමයි, අපි යම් බලවත් කම්යක් කරොත් මේ කම්ය බලවත් වෙන්න අවිද්‍යාව කියන ධම්ය හේතුවෙලා තමයි ඒ කම්ය බලවත් වෙන්නේ. ඒ වෙනුවෙන් දැන් ඊට පස්සේ අපි ධම්ශ්‍රවණය කරළා, මේ අකුසල කම් කියන්නේ මේවා යි, අකුසල කම්යේ ප්‍රතිසන්ධි විපාක දෙනවා නම් දෙන්නේ මෙන්න මේ මෝඩකම නිසා කියලා කෙනෙක් දැනගෙන, අර අකුසලයත් අපි කරපු දේ තියෙනවා, ඉන්නවා කියලා ගත්තු නිසා නේ මේ අකුසලය දැන් පවතින්නේ. දැන් එයා දකිනවා, මට බොරුවක් කියන්න හේතුවුණා නම් ඒ

තිබිච්චි රූපයත් එතැන නිරුද්ධ යි. වේදනාවත් නිරුද්ධ යි, සංඥාවත් නිරුද්ධ යි. සංඛාරය, විඤ්ඤාණය මේ සියල්ල ම නිරුද්ධ යි. නමුත් ඒ තැන කර්මයක් හටගත්තා නම්, කර්මය කොහේහරි මෙහේ තැන්පත් වෙනවා ද? නැහැ. ඒ චේතනාවත් නිරුද්ධ යි. නමුත් ඒවා ඇතිබවට ගන්න මෝඩකම අප තුළ තියෙන නිසා මේකේ විපාකය සකස්වෙනවා.

යම් දවසක ඔහු සම්මාදිට්ඨිය උපදවාගෙන අර හටගත්තු ධර්මයේ නිරෝධය දැක්කොත් ඔහුට ඒකෙන් ප්‍රතිසන්ධි විපාකයක් දෙනවා. මැරෙණකොට තමන්ට අපි කියමු තරහක් (හොඳට ඒක තේරුම්ගන්න.) මට ආවා භාවනා කරන්න පෙර තරහ සිත් බොහෝ ඉපදුනා. පසු කාලයක ඔහු මෛත්‍රීභාවනාව කරලා කරලා කරලා අර ද්වේශය නැතිකරගත්තා. දැන් ඒ අරමුණ හම්බවුණාට එයාට තරහක් එන්නේ නැහැ. මුලින් හම්බවුණා. දැන් මොකද වුණේ? එයාට පසුව උපදවාගත්තු කුසල ශක්තියෙන් අර අකුසල් බලය යටපත්කරා ද නැද්ද? යටපත් කිරීමක් කළා. ඒ නිසා කර්ම නිරෝධය කියන එකක් මේ ශාසනයේ තියෙනවා. කර්ම නිරෝධයක් නො තිබුණා නම් අපට, කරපු කර්ම විඳලා ම අවසන් කරන්න වෙනවා නම් කවදාවත් අපට මේ රහත්වෙන්න පුළුවන්කමක් නැහැ. කර්මක්ෂය කරන්න පුළුවන්කමක් නැහැ. අන්න ඒ නිසා ඒක පටලවාගන්න එපා. අරම වීමකුත් තියෙනවා. නමුත් මේ ශාසනයේ විතරයි. මම ඒකයි කිව්වේ ලොවුතුරා සම්මා සම්බුද්ධ ශාසනයේ හැකියාවක් තියෙනවා ඒ කර්ම ටික ක්ෂයකරළා දාලා මාර්ගඥානයක් උපදවාගෙන ඒවා විපාක දීමේ හැකියාව සහමුළින් ම නැකිරලා දාන්න. ප්‍රතිසන්ධි විපාක වශයෙන්.

ප්‍රශ්නය:- (අපැහැදිලි යි.) ස්වාමීන් වහන්සේ කිව්වා අකුසල් කරහම ඒක හිතන හිතන කොට ... කුසල් කරහම ඒක ගැන හිතන්න පුළුවන් ද?

පිලිතුර:- පුළුවන්. කුසලයකුත් ආසේවන ප්‍රත්‍යයක් වෙලා කුසලයත් ශක්තියක් බවට පත්වෙන්න පුළුවන්. ඒක නේ කියන්නේ, කුසලයක් කරන කොට පූර්වචේතනා, මුඤ්චනචේතනා, අපරචේතනා කියලා. පාරමිතාවක් බවට පත්වෙනවා නම්, කුසලයක් කරන අවස්ථාවෙත් ඒක ගැන හොඳට සිහිකරගන්න. කුසලයක් කරන්න පෙරත්, කරන අවස්ථාවෙත් කරළා ඉවරවෙලත්, නැවත නැවත මේ කුසලය සිහිපත් කරන්න කියනකොට අර කුසලය කියන එක ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවෙලා ඒක කුසලය බලවත් එකක් බවට පත්වෙනවා. ඒකම තමයි අපි දැන් ඒ කුසලය දැන් දෙපැත්තක් තියෙනවා නේ. කෙනෙක් දානයක් කරළා ඒ දානයෙන් දිව්‍ය සැප බලාපොරොත්තුවෙන් ඒක නැවැත නැවැත සිහිකරනවා. මේක සසර යන්න හේතුවෙනවා. නමුත් අපි දානයක් දුන්නා. දැන් ඒ දාන චේතනාව නැවැත නැවැත සිහි කර කර බලවත් කරන්නේ මොකක් නිසා ද? අනේ මේ දාන චේතනාව නිසා මට මේ දුක් කෙළවර කරගන්න ම ලැබේවා. සත්පුරුෂයන් හම්බවෙන්න සුදුසු ප්‍රදේශයන්වල ඉපදිලා මට මේ කෙලෙස් දුරුකරගන්න මේ දාන චේතනාව හේතුවේවා කියලා ඒ විදියට අර දානය ගැන ආසේවනය කරනවා. දැන් ඒක කුසල් සිතක් බලවත්වුනා. නමුත් මේ කුසලයෙන් විපාකය නිවීනය පැත්තට තමයි හරවන්නේ. ඒ නිසා අපගේ ප්‍රාර්ථනාවක් ඉෂ්ඨකරළා දෙන බවක් කමීය තුළ තියෙනවා. දැන් අපි අභිනිහාර කියන්නේ ඒවාට යි. බෝසතානන් වහන්සේ කල්ප අසංඛ්‍ය ගණනක් ම සර්ඥතාඥානය ම අරමුණු කරගෙනයි පින්කරන්නේ. එතකොට ඒවා හැම කුසලයක් ම සර්ඥතාඥානයට යි ඒකයි උපකාර කරළා ිතයෙන්නේ. ඒ වාගේ කෙනෙක් රහත්බව අරමුණු කරගෙන කුසල් කරනවා. ඒවා නැවැත නැවැත සිහිකරනවා. ඒ නිසා අපි භවය ප්‍රාර්ථනා කරගෙන කුසල්

කරනවා නම් ඒක සුදුසු නැහැ. නමුත් නිවන ප්‍රාර්ථනාකරගෙන කුසල් කරොත් ඒ කිසිදු කුසලයක් අපට සසර යන්න හේතුවෙන්නේ නැහැ. සසර ගලවාගන්න ම යි හේතුවෙන්නේ. ඒ නිසා ඒක පටලවාගත්තු අය තමයි කුසල් කරන්න එපා. කුසල් කරොත් සසර යනවා කියලා මේ වැරැදි අදහසක් ඔළුවලට දාලා තියෙන්නේ. මිත්‍යාදෘෂ්ඨියක්. මේ කර්මයෙන් කරන මේ හැරැවීම්, මේ උපකාර අපේ නො දන්නාකම යි.

තෙරුවන් සරණයි.

පිටකවරයේ ඇතුල් පැත්ත.

ආසේවන ප්‍රත්‍යය කියන එක අපට බොහෝම වැදගත් සමීප ප්‍රත්‍යයක්. අපි ජීවත්වෙන කොට අපි දකින අහන සිද්ධීන් තුළ කුසල්-අකුසල් සිත් ඇතිවෙනවා. දැන් අපි කියමුකෝ රූපයක් දැක්කහම ඒක අරමුණු කරගෙන ලෝභ සිතක් උපදිනවා. **ඒ ලෝභ සිත ඉපදිච්චි පමණකින් ඒක අපට අපායේ ප්‍රතිසන්ධි දෙන්න හේතුවෙන්නේ නැහැ. එහෙම හේතුවෙනවා නම් කිසි කෙනෙක් සුගතියේ යන්නේ නැහැ.** ඔය බොහෝ ලෝභ මූල සිත් අපට ජීවිතය තුළ උපදිනවා. හැබැයි ඒ ලෝභමූල සිත, කම්පථයක් බවට පත්වුණහම තමයි ප්‍රතිසන්ධි විපාක ගෙනැත් දෙන්නේ. කම්පථයක් බවට පත්වෙන්නේ මෙන්න මේ කියන ආසේවන ප්‍රත්‍ය ශක්තිය නිසා යි. ඒ නිසා අප තුළ අකුසල කම්, කම් පථ බවට පත්වෙලා කම් රැස්කරගෙන, ඒ දේවල් අපට සිතෙන් අයින්කරගන්න බැරි තත්ත්වයකට පත්වෙන ප්‍රත්‍ය ශක්තියක් තියෙනවා. අන්න ඒක තමයි අපි තේරුම්ගන්න ඕන. ඒක තේරුම්ගන්න එක ඉතාමත් ම වටිනා සිද්ධියක්.

ප්‍රතිසන්ධියක් ගත්තහම පෙර කර්මය නිසා මේ ජීවිතයේ දී ප්‍රතිසන්ධි විපාක සිතක් උපදිනවා. කර්මය කියන එකත් අනාත්ම ධර්මයක්; විපාක කියන එකත් අනාත්ම ධර්මයක්. නමුත් ඒ මේ ප්‍රතිසන්ධි ක්‍රියාවලිය නො දන්නා කෙනා පුද්ගලයෙක් ඉපදෙනවා කියලා එයා දන්නවා. සත්වයෙක් භවයෙන් භවය උපදිනවා කියලා ප්‍රතිසන්ධිය වරදවාගන්නවා. චුතියේ දී මුළාවෙනවා කියලා කියන්නේ, මේ පැවැති ස්කන්ධ ටික නිරුද්ධ වෙනවා. නිරුද්ධභාවයට පත්වෙනවා. නමුත් ඒ ස්කන්ධ ටික පුද්ගලභාවයෙන් අරගෙන ඒ නිරෝධය, කෙනෙක් මැරුණා - පුද්ගලයෙක් මැරුණා කියලා මුළාවෙනවා. චුතියේ දී ත් මුළාවෙනවා. ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ගෙ ත් මුළාවෙනවා. දැන් අපට අකුසල් සිතක් උපදින කොට අපි දන්නේ නැහැ, මේ අවිද්‍යාව නිසා යි මේ සංඛාරය හටගත්තේ කියලා. ඔහු හිතන්නේ, මට මෙහෙම කල්පනාවක් ඇතිවුණා. මෙහෙම දෙයක් නිසා තමයි මට මෙහෙම සිත් ඉපදුණේ කියලා ඒ විදියට මේ විදියේ අවිද්‍යාව නිසා මේ පටිච්චසමුප්පාද ධර්මයන්ගේ ද මුළාවට පත්වෙනවා.